# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# PROGRESS REPORT



# 2024











**ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය**

**වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය**

**போக்குவரத்து, பெருந்தெருக்கள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு**

**துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரிவு**

**Ministry of Transport, Highways, Ports & Civil Aviation**

**Ports & Civil Aviation Section**

# ප්‍රගති වාර්තාව
# 2024

## ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
### වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය

19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන : 011-2439352, 011-2435161
වෙබ්: www.portmin.gov.lk
විද්‍යුත් ලිපිනය: secretary@portmin.gov.lk

| පටුන | | පිටු අංකය |
|---|---|---|

I කොටස


| | | |
|---|---|---|
| **1. වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය** | | **6-33** |
| 1.1 ආයතන අංශය | 11-15 | |
| 1.2 ගිණුම් අංශය | 15-19 | |
| 1.3 සංවර්ධන අංශය | 20-21 | |
| 1.4 විගණන අංශය | 21-23 | |
| 1.5 ගුවන්සේවා අංශය | 24-33 | |


II කොටස


| | |
|---|---|
| **2. වෙළඳ නාවික ලේකම් කාර්යාලය** | **34-41** |
| **3. ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | **42-57** |
| **4. සී/ ස ලංකා නැව් සංස්ථාව** | **58-63** |
| **5. ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්** | **64-67** |
| **6. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය** | **68-79** |
| **7. ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම** | **80-88** |

2024 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස අවසානය දක්වා වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන මෙම වාර්තාව 2025 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කිරීමට පිළියෙල කර ඇත.

## I කොටස

වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයේ පොදු තොරතුරු, සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.

## II කොටස

වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට නතුවන ආයතන වන

- වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- සීමාසහිත ලංකා නැව් සංස්ථාව
- ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
- ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

අදාල කාලසීමාව තුල ළඟා කර ගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් ඉදිරිපත් කර ඇත.

# I කොටස

# වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය

## දැක්ම

**“දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සාමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සාමුද්‍රීය සේවාවන් ලබාදීම”**

සහ

**“කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම.”**


## මෙහෙවර

**“ජාතික ආර්ථික වර්ධනය සඳහා සාමුද්‍රික ප්‍රවාහන කටයුතු ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවික සේවාවන් සැළසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්‍ෂම යාන්ත්‍රණයක් සැකසීම”**


සහ

**“අදාළ ආර්ථික අංශවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ගුවන් ප්‍රවාහන සේවා කාර්යක්ෂම, ආරක්ෂිත සහ පරිශීලක-හිතකාමී සේවාවන් බවට පත් කිරීම.”**

## වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට නතුවන ආයතන



## ප්‍රධාන අංශයන්




2024 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තොරතුරු - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය (වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය)

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් සංග්‍රහය | අනුමත කාර්ය මණ්ඩලය | සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| ලේකම් | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 4 | 01 | 01 | - |
| අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | - | 01 |
| අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| අතිරේක ලේකම් (ගුවන් සේවා) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම සම්පාදන) | ශ්‍රී ලං ක්‍ර සේ | විශේෂ | එස්එල් 3 | 01 | - | 01 |
| අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං ඉ සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී ලං ග සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 02 | 02 | - |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 01 | 01 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං ක්‍ර සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලං ඉ සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 01 | - | 01 |
| ගණකාධිකාරී | ශ්‍රී ලං ග සේ | III/II | එස්එල් 1 | 02 | 02 | - |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං ග සේ | III/II | එස්එල් 1 | 01 | - | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ක්‍ර සේ | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ඉ සේ | III/II | එස්එල් 1 | 01 | - | 01 |
| නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | - | රු.41,410/- (මාසික) (රා.පරි.චක්‍ර. අංක 03/2016 හි IV අනුව) | 01 | - | 01 |
| පරිපාලන නිළධාරි | ක සේ නි සේ | අධි ශ්‍රේණිය | එම්එන් 7 | 01 | 01 | - |
| භාෂා පරිවර්ථක | භාෂාපරිවර්ථක සේවය | II/I | එම්එන් 6 | 01 | - | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී. ලං. තො. හා ස. තා. සේවය | 2 පන්තිය II/I | එම්එන් 6 | 01 | - | 01 |
| සංවර්ධන නිළධාරි | සං නි සේ | III/II | එම්එන් 4 | 40 | 34 | 06 |
| කළමනාකරණ සේවා නිලධාරී | ක සේ නි සේ | III/II/I | එම්එන් 2 | 20 | 14 | 06 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී. ලං. තො. හා ස. තා. සේවය | 3 පන්තිය III/II/I | එම්ටී 1 | 01 | - | 01 |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේ | III/II/I/ විශේෂ | පීඑල් 3 | 13 | 13 | - |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | III/II/I/ විශේෂ | පීඑල් 1 | 14 | 12 | 02 |
| වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | - | රු. 29.840/- +රු 7800 (මාසික) | 01 | - | 01 |
| නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | - | රු. 29.840/- +රු 7800 (මාසික) | 01 | 01 | - |
| ඡායාරූප ශිල්පී සහායක | තාවකාලික | - | රු. 24.250/- +රු 7800 (මාසික) | 01 | - | 01 |

# වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට අයත් අංශ විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

## 1.1 ආයතන අංශය

### 1.1.1 ඉටුකළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය

#### i.) නීති හා අධිකරණ කටයුතු

- අමාත්‍යාංශ වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේදී පැන නැගුන නීතිමය ගැටලු සම්බන්ධව අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු 76ක් සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- Association of Container Depot Operators (ACDO) ආයතනය සම්බන්ධයෙන් වූ නව පනත සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අවසන් කෙටුම්පත සකස් කිරීම සහ එම ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් 2024 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව පත් වූ නව අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ලබා ගැනීම සඳහා නව කැබිනට් පත්‍රයක් ඉදිරිපත් කිරීම.

- සීමාසහිත මාගම්පුර වරාය කළමණාකරණ පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා උපදේශක එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් උපදෙස් අනුව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත යොමු කිරීම.

- 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත යටතේ රෙගුලාසි සකස් කිරීම හා එම රෙගුලාසි පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ රෙගුලාසි සකස් කිරීම සහ එම රෙගුලාසි පාර්ලිමේන්තු අනුමැතියට යොමු කිරීම.

- 1982 අංක 01 දරන වරායවල් පිළිබඳ අධිකාරිය (ධීවර බෝට්ටු හා දැල් පරිහරණය කිරීම පාලනය කිරීම) නියොග සංශෝධනය සඳහා වූ රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාතමේන්තුව වෙත යොමු කිරීම.

#### ii.) මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම

2024 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2018 යටතේ වාහන ආනයන බලපත්‍ර 26 ක් නිකුත් කර ඇත. විශ්‍රාම ලබා ගන්නා ලද නිලධාරීන් සඳහා 22/99 යටතේ බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් පත් 04 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශය මඟින් අයදුම්පත් යොමු කර ඇත.

### iii.) වරාය ගාස්තු සහන ලබා ගැනීමට අදාළ ඉල්ලීම්

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලද ඉල්ලීම් 26 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිගෙන් විමසා ඇති අතර ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කර ඇත.

| ප්‍රගතිය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත කළ ඉල්ලීම් ගණන | 23 |
| අනුමත නොකළ ඉල්ලීම් ගණන | 01 |
| CICT/ SAGT/ Hambanthota Port මඟින් පාලනය වන බහළු බවට දන්වා ඇති ඉල්ලීම් | 02 |
| වාර්තා ලැබී නොමැති ඉල්ලීම් | - |

### iv.) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ලියාපදිංචිය

අදාළ කාලය තුළ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා මාර්ග ගත ක්‍රම වේදය අනුව ලියාපදිංචි කටයුතු සිදු කර නොමැත.

බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් ඒකාබද්ධ රියදුරු සේවයේ තනතුරු 04 කට හා කාර්යාල සේවක සේවයේ තනතුරු 04 කටත් බඳවාගන්නා ලදි. මොවුන් හට අමාත්‍යාංශය මඟින් තාවකාලික පත්වීම් ලිපි ලබා දුන් අතර ඉදිරියේ දී ස්ථිර පත්වීම ලැබීමට නියමිතයි. විධිමත් පත්වීම් ලිපි ලද පසු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා මාර්ග ගත ක්‍රම වේදය අනුව ලියාපදිංචි කටයුතු සිදු කිරීමට නියමිතය.

### v.) විශ්‍රාමික කටයුතු

අමාත්‍යාංශයේ නිලධාරීන් 04 දෙනෙකු විශ්‍රාම ගිය අතර විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය හරහා එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලදි.

### vi.) වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල විෂය පථයන්ට අදාලව මෙතෙක් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඊට අදාල කටයුතුද සම්පූර්ණ කර ඇත.

### vii.) මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු

මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු සභාව විසින් මෙම අමාත්‍යාශය වෙත යොමු කරන පැමිණිලි, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට යොමු කර වාර්තා ගෙන්වා ගැනීම සහ අදාල වාර්තා සමඟ මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සිදු කරනු ලබයි.

මෙම කාලසීමාව තුළ දී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශය වෙත පැමිණිලි යොමු කර නොමැත.

### viii.) පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සම්බන්ධ කටයුතු

අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතනවල දැනට සේවයේ නියුතු සහ නියුක්තව සිටි නිලධාරීන්ගේ මෙන්ම අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන්හි පැමිණිලි සම්බන්ධ ක්‍රියා කිරීම සහ සහන සැලසීම මෙම කාරක සභාව මඟින් සිදුවේ.

මෙම වසර තුළ දි පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පැමිණිලි 10 ක් ලැබී ඇත.

### ix.) වීසා නිර්දේශ ලබාදීම

පහත දැක්වෙන පරිදි මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් හි නිලධාරීන් හට වීසා නිර්දේශය ලබා දී ඇත.

| ආයතනය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 270 |
| ලංකා නැව් සංස්ථාව | 192 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 230 |
| සීමා සහිත ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 28 |

### x.) ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන අභියාචනා

ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන මහජන ඉල්ලීම්, පැමිණිලි හා අභියාචනා මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ පසුව අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වලින් අදාල ආයතනය වෙත එම ගැටළු යොමු කිරීම සිදුකරනු ලබයි. එසේම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවන ගැටළු අදාල විෂය පථයට අයත් අමාත්‍යාංශ වෙත යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

ජනාධිපති කාර්යාලය විසින් මෙම වසර තුළ මේ දක්වා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අභියාචනා ගණන 69 ක් වන අතර එම අභියාචනා වලින් 39 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ද, 03 ක් වෙළඳ නාවික ලේකම් කාර්යාලයට ද, 01 ක් ශ්‍රී ලංකා නැව් සංස්ථාවට ද 14 ක් ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පුද්ගලික) සමාගමට ද, 05 ක් සිවිල් ගුවන් සේවා අධිකාරියටද, 05 ක් ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමට ද, 01ක් ශ්‍රී ලංකා කේටරින් (පුද්ගලික) සමාගමටද, 01 ක් ශ්‍රී ලංකා වරාය කළමණාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගමටද වශයෙන් වෙන් කර දැක්විය හැක.

ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි අමාත්‍යාංශය වෙත යොමු කළ පසුව අමාත්‍යාංශය මඟින් අදාල අනුබද්ධ ආයතන වෙත එම ගැටළු යොමු කිරීමේ දී අදාල පිළිතුරු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයට හා ජනාධිපති කාර්යාලයට පිටපත් සහිතව අභියාචනාකරු දැනුවත් කරන ලෙස දන්වා ඇත. ඇතැම් අවස්ථාවල දී අභියාචනාකරුවන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත පමණක් පිළිතුරු ලැබේ. එහිදී අමාත්‍යාංශ මඟින් එම පිළිතුරු ජනාධිපති කාර්යාලය වෙත දැනුම් දීමට කටයුතු කරනු ලබයි.

### xi.) විදේශ නිවාඩු අනුමැතිය

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් හි නිලධාරීන් හට පහත අවශ්‍යතා අනුව විදේශ නිවාඩු අනුමැතිය ලබා දී ඇත.

| ආයතනය | කාණ්ඩය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | පෞද්ගලික නිවාඩු (විධායක)<br>පෞද්ගලික නිවාඩු (විධායක නොවන)<br>රාජකාරී<br>රැකියා<br>ක්‍රීඩා සඳහා නිවාඩු | 56<br>156<br>128<br>5<br>42 |
| **ලංකා නැව් සංස්ථාව** | පෞද්ගලික නිවාඩු | 02 |
| **වෙළඳ නාවික ලේකම් කාර්යාලය** | රාජකාරී | 20 |
| **ජයා කන්ටේනර් ටර්මිනල්ස්** | පෞද්ගලික නිවාඩු<br>රාජකාරී | 07<br>03 |
| **ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම** | පෞද්ගලික නිවාඩු | 07 |

### xii.) අමාත්‍යාංශ නිළධාරීන්ගේ පුහුණු සහ වැඩමුළු

දේශීය පුහුණු

| අනු අංකය | පුහුණු වැඩමුළුවේ නම | පුහුණු වැඩමුළුව පැවැත්වූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ශාස්ත්‍රපති විභාගය | සර්. ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 01 |
| 02 | පශ්චාත් උපාධි පාඨමාලාව | කොළඹ විශ්ව විද්‍යාලය | 01 |
| 03 | තොරතුරු තාක්ෂණය සහ මා.ස. කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම | 01 |
| 04 | Secretarial Practices | නිපුණතා පියස | 01 |
| 05 | ප්‍රවාහන කළමනාකරණය | ප්‍රාග් ආයතනය | 01 |
| 06 | විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | SDFL | 01 |
| 07 | වියදම් හා ගෙවීම් පටිපාටිය | ප්‍රාග් ආයතනය | 01 |
| 08 | රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිය | ප්‍රාග් ආයතනය | 05 |
| 09 | වාර්ෂික ගබඩා සමීක්ෂණ සහ භාණ්ඩ අපහරණය | ප්‍රාග් ආයතනය | 02 |
| 10 | විගණන පනත හා රාජ්‍ය සේවක වගකීම | ප්‍රාග් ආයතනය | 03 |
| 11 | වාර්ෂික ගබඩා සමීක්ෂණය | Metropolitan Campus | 01 |
| 12 | කාර්යාල කාර්ය සහායකයින්ගේ කාර්යය භාරය පිළිබඳ පුහුණු වැඩමුළුව | නිපුණතා පියස | 02 |

| | | | |
|---|---|---|---|
| 13 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | Metropolitan Campus | 01 |
| 14 | ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව (මූලික) | මහපොළ වරාය සහ සමුද්‍රීය ඇකඩමිය | 04 |
| 15 | මානව සම්පත් සැලැස්ම සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළුව | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 02 |

විදේශ පුහුණු

| අනු අංකය | පුහුණු වැඩමුළුවේ නම | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 1st Trade Facilitation Capacity Building Program for BIMSTEC Countries | 01 |
| 02 | Program of Diplomacy & International Relations from 05th to 13th August 2024 | 01 |
| 03 | seminar on Maritime Transport Management for Developing Countries | 04 |
| 04 | Navigating Global Conflicts | 01 |
| 05 | Smart Port Visit to the USA - Capacity Development Project | 01 |
| 06 | Advanced Seminar on Infrastructure Connectivity | 01 |
| 07 | Spacecraft Dynamics and Control | 01 |
| 08 | Seminar on Free Trade Zone (Port) Construction fo Sri Lanka | 02 |
| 09 | South Asia Sub regional Economic Cooperation (SASEC) Program's Working Group Meetings and Senior Officials Meeting for 2024 being held in Thimphu in November 2024 | 02 |

## 1.2 ගිණුම් අංශය

### 1.2.1 ඉටුකළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය

- අයවැය ඇස්තමේන්තු සැකසීම.
- අක්මුදල ගිණුම සකස් කිරීම.
- වාර්ෂික අග්‍රිම සීමාව සකස්කිරීම, මාසික අග්‍රිම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම සහ අග්‍රිම ගිණුම සකස්කිරීම.
- අත්තිකාරම් බී ගිණුම පිළියෙල කිරීම හා සැසඳුම් ප්‍රකාශය මාසිකව පිළියෙල කිරීම.
- බැංකු කටයුතු මෙහෙයවීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම.
- පුද්ගල පඩිනඩි අතිකාල, දීමනා සහ අනෙකුත් ගෙවීම් සිදුකිරීම.
- මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම්, අදාල ආයතන වලට ඉදිරිපත් කිරීම.
- සැපයුම් කළමනාකරණය.
- ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම.
- භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදුකිරිම සහ වාර්තාව සකස් කිරීම.

- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.
- මුදල් පොත පවත්වාගෙනයාම සහ සහ දෛනිකව තුලනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සැකසීම.
- විසර්ජන වැය ලෙජරය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- වරාය ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම් කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහ රාජ්‍ය ව්‍යාපාර ගිණුම් කාරක සභාවට අදාළ කාර්යයන් සිදුකිරීම.
- විශ්‍රාම වැටුප් ගොනු ලේඛන පවත්වාගෙන යාම.
- සරප් රාජකාරී සිදුකිරීම.
- ITMIS (Integrated treasury Management information System) පද්ධතිය මගින් ගිණුම් කටයුතු පවත්වාගෙන යාම.
- CIGAS පද්ධතියට ගණුදෙණු ඇතුලත් කිරීම හා මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## 1.2.2 වියදම් වාර්තාව - 2024.12.31 දිනට

**176 වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය**

| 1 - මෙහෙයුම් වැඩසටහන<br>01 - අමාත්‍ය කාර්යාලය | | | | |
|---|---|---|---|---|
| **වැය විෂය** | **කාණ්ඩය/ විෂය** | **ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.)** | **සමුච්චිත වියදම** | **වියදම් ප්‍රතිශතය %** |
| | **පුනරාවර්තන වියදම** | **69,419,327.44** | **52,801,072.90** | **76.06** |
| | **පුද්ගල පඩිනඩි** | **28,000,000.00** | **20,314,778.97** | **72.55** |
| **1001** | වැටුප් හා වේතන | 15,700,000.00 | 10,275,716.74 | 65.45 |
| **1002** | ඇතිකළ හා නිවාඩු දින වැටුප් | 5,500,000.00 | 3,284,080.59 | 59.71 |
| **1003** | වෙනත් දීමනා | 6,800,000.00 | 6,754,981.64 | 99.34 |
| | **ගමන් වියදම්** | **5,000,000.00** | **3,475,754.36** | **69.52** |
| **1101** | දේශීය | 2,000,000.00 | 1,610,314.00 | 80.52 |
| **1102** | විදේශීය | 3,000,000.00 | 1,865,440.36 | 62.18 |
| | **සැපයුම්** | **23,100,000.00** | **19,659,411.69** | **85.11** |
| **1201** | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,000,000.00 | 1,991,455.45 | 99.57 |
| **1202** | ඉන්ධන | 21,000,000.00 | 17,667,956.24 | 84.13 |
| **1203** | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000.00 | - | - |
| | **නඩත්තු වියදම්** | **4,900,000.00** | **4,708,706.78** | **96.10** |
| **1301** | වාහන | 4,400,000.00 | 4,324,155.88 | 98.28 |
| **1302** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 384,550.90 | 76.91 |

| | | | | |
|---|---|---|---|---|
| | **සේවා** | **8,169,327.44** | **4,642,421.10** | **56.83** |
| **1401** | ප්‍රවාහන | 1,938,527.44 | 799,784.93 | 41.26 |
| **1402** | තැපැල් හා සන්නිවේදන | 3,000,000.00 | 1,855,992.97 | 61.87 |
| **1403** | විදුලිය හා ජලය | 730,800.00 | - | 0.00 |
| **1404** | කුලී සහ බදු | 500,000.00 | - | - |
| **1409** | වෙනත් | 2,000,000.00 | 1,986,643.20 | 99.33 |
| | මාරු කිරීම් | 250,000.00 | - | - |
| **1502** | මාරු කිරීම් | 250,000.00 | - | - |
| | **ප්‍රාග්ධන වියදම් ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම්** | **21,650,000.00** | **18,754,265.20** | **86.62** |
| | ප්‍රාග්ධන වත්කම් | 19,650,000.00 | 18,607,200.30 | 94.69 |
| **2002** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | - | 0.00 |
| **2003** | වාහන | 18,650,000.00 | 18,607,200.30 | 99.77 |
| | **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්** | **2,000,000.00** | **147,064.90** | **7.35** |
| **2102** | ලීබඩු හා කාර්යාල උපකරන | 1,000,000.00 | 96,088.90 | 9.61 |
| **2103** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 50,976.00 | 5.10 |
| | **මුළු එකතුව** | **91,069,327.44** | **71,555,338.10** | **78.57** |

| 1 - මෙහෙයුම් වැඩසටහන<br>02 - පරිපාලන සහ ආයතනික සේවා | | | | |
|---|---|---|---|---|
| **වැය විෂය** | **කාණ්ඩය/ විෂය** | **ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.)** | **සමුච්චිත වියදම** | **වියදම් ප්‍රතිශතය %** |
| | **පුනරාවර්තන වියදම** | **326,930,672.56** | **242,003,828.29** | **74.02** |
| | **පුද්ගල පඩිනඩි** | **90,450,000.00** | **86,207,376.64** | **95.31** |
| **1001** | වැටුප් හා වේතන | 51,000,000.00 | 49,378,564.81 | 96.82 |
| **1002** | අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,200,000.00 | 2,320,516.00 | 55.25 |
| **1003** | වෙනත් දීමනා | 35,250,000.00 | 34,508,295.83 | 97.90 |
| | **ගමන් වියදම්** | **2,360,000.00** | **1,654,021.69** | **70.09** |
| **1101** | දේශීය | 700,000.00 | 562,308.00 | 80.33 |
| **1102** | විදේශීය | 1,660,000.00 | 1,091,713.69 | 65.77 |
| | **සැපයුම්** | **24,180,000.00** | **15,026,024.20** | **62.14** |
| **1201** | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 5,000,000.00 | 3,503,135.73 | 70.06 |
| **1202** | ඉන්ධන | 19,100,000.00 | 11,466,888.47 | 60.04 |
| **1203** | ආහාරපාන හා නිල ඇඳුම් | 80,000.00 | 56,000.00 | 70.00 |
| **1205** | වෙනත් | - | - | - |
| | **නඩත්තු වියදම්** | **8,550,000.00** | **5,446,387.50** | **63.70** |
| **1301** | වාහන | 7,500,000.00 | 4,399,402.08 | 58.66 |
| **1302** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,050,000.00 | 1,046,985.42 | 99.71 |
| | **සේවා** | **74,821,472.56** | **66,032,009.43** | **88.25** |

| | | | | |
|---|---|---|---|---|
| **1401** | ප්‍රවාහන | 5,000,000.00 | 4,636,729.47 | 92.73 |
| **1402** | තැපැල් හා සන්නිවේදන | 2,500,000.00 | 2,134,020.66 | 85.36 |
| **1403** | විදුලිය හා ජලය | 2,550,000.00 | 294,654.99 | 0.00 |
| **1404** | කුලී සහ බදු | 53,100,000.00 | 48,293,929.66 | 90.95 |
| **1405** | පවිත්‍රතා කටයුතු | 4,000,000.00 | 3,459,037.50 | 86.48 |
| **1408** | මෙහෙයුම් කල්බදු යටතේ මිලදී ගත් වාහන සඳහා ලීසිං කුලිය | 1,750,000.00 | 1,642,560.00 | 93.86 |
| **1409** | වෙනත් | 5,921,472.56 | 5,571,077.15 | 94.08 |
| | **මාරු කිරීම්** | **126,100,000.00** | **67,171,951.58** | **53.27** |
| **1503** | රාජ්‍ය ආයතන | 125,000,000.00 | 66,463,806.69 | 53.17 |
| **1506** | රාජ්‍ය සේවක දේපළ ණය පොළීආයතන | 1,000,000.00 | 672,144.89 | 67.21 |
| **1508** | වෙනත් | 100,000.00 | 36,000.00 | 36.00 |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 469,200.00 | 466,057.25 | 99.33 |
| **1701** | ණය කපාහැරීම් | 119,200.00 | 119,200.00 | 100.00 |
| **1703** | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 350,000.00 | 346,857.25 | 99.10 |
| | **ප්‍රාග්ධන වියදම්** | **14,000,000.00** | **13,454,070.52** | **96.10** |
| | **ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම්** | **11,500,000.00** | **11,439,141.67** | **99.47** |
| **2002** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 700,000.00 | 639,542.02 | 91.36 |
| **2003** | වාහන | 10,800,000.00 | 10,799,599.65 | 100.00 |
| | **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්** | **2,000,000.00** | **1,516,928.85** | **75.85** |
| **2102** | ලීබඩු හා කාර්යාල උපකරන | 1,209,345.75 | 1,204,304.85 | 99.58 |
| **2103** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 790,654.25 | 312,624.00 | 39.54 |
| | **හැකියා වර්ධනය** | **500,000.00** | **498,000.00** | **99.60** |
| **2401** | පුහුණු හා කුසලතා වර්ධනය | 500,000.00 | 498,000.00 | 99.60 |
| | **මුළු එකතුව** | **340,930,672.56** | **255,457,898.81** | **74.93** |

| 2 - සංවර්ධන වැඩසටහන<br>04 - වරාය සංවර්ධනය | | | | |
|---|---|---|---|---|
| **වැය විෂය** | **කාණ්ඩය/ විෂය** | **ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.)** | **සමුච්චිත වියදම** | **වියදම් ප්‍රතිශතය %** |
| | **පුනරාවර්තන වියදම** | **850,000,000.00** | **353,755,493.93** | **41.62** |
| **23-1509 11** | **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** - සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය | 850,000,000.00 | 353,755,493.93 | 41.62 |
| | **ප්‍රාග්ධන වියදම්** | **7,934,000,000.00** | **991,165,700.34** | **12.49** |
| **21-2104 17** | **කන්කසන්තුරෙ වරාය** ප්‍රතිසංස්කරණය කිරීම ගොඩනැගිලි ඉදිකිරීම් | 765,000,000.00 | - | - |
| **21-2302 12** | ණය දීම | 3,826,000,000.00 | - | - |
| **24-2302 12** | **කුළුණු මතින් ඉදිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය** යටිතල පහසුකම් සංවර්ධනය | 400,000,000.00 | 158,930,723.04 | 39.73 |
| **24-2104 17** | ගොඩනැගිලි ඉදිකිරීම් | 53,000,000.00 | - | - |
| **28-2105 12** | **බටහිර බහළු පර්යන්ත II සඳහා බටහිර දියකඩනය දිගු කිරීම පිණිස වන විස්තරාත්මක සැලසුම** ඉඩම් හා ඉඩම් වැඩිදියුණු | 560,000,000.00 | 2,506,739.30 | 0.45 |
| **29-2 104** | හිඟුරක්ගොඩ ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය | 2,000,000,000.00 | 500,490,000.00 | 25.02 |
| **26-2509 11** | **සූරියවැය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය (ණය නැවත ගෙවීම)** වෙනත් | 330,000,000.00 | 329,238,238.00 | 99.77 |
| | **මුළු එකතුව** | **8,784,000,000.00** | **1,344,921,194.27** | **15.31** |

## 1.3 සංවර්ධන අංශය

### 1.3.1 ඉටුකළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය

- අමාත්‍යාංශයේ දැක්ම අනුව අදාළ අරමුණු ළඟාකර ගැනීමට හැකිවන අයුරින් නව ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අනුමැතීන් ලබා ගැනීම, සංවර්ධන කටයුතු අධීක්ෂණය හා ප්‍රගතිය විමසා බැලීම මූලික කාර්යයන් අතර වේ. අමාත්‍ය මණ්ඩල සංදේශ 101 ක් 2024.12.31 වන විට ඉදිරිපත් කරන ලද අතර ඒවායින් පත්‍රිකා 93 ක් සඳහා අනුමැතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08 ක් සඳහා අනුමැතිය අපේක්ෂිතය.
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 23 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත යොමුකිරීම.
- 2024 වසර සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් ආයතනවලට ඉදිරිපත් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. මාසික /ත්‍රෛමාසික/ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

### 1.3.2 සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| | ව්‍යාපෘතියේ නම | මූල්‍ය ප්‍රභවය | ක්‍රියාත්මක කරන ආයතනය | සංශෝධිත ඇස්තමේන්තුව | 2024.12.31 දිනට වියදම |
|---|---|---|---|---|---|
| 1 | වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය (වැඩහල් ප්‍රතිස්ථාපනය) | ADB | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | රු.මි. 2,039 | රු.මි. 1,659 |
| 2 | කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | Exim Bank India | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | රු.මි. 18,326.9 | රු.මි. 197.48 |
| 3 | බටහිර බහළු පර්යන්ත II සඳහා බටහිර දියකඩනය දිගු කිරීම පිණිස වන විස්තරාත්මක සැලසුම ඉඩම් හා ඉඩම් වැඩිදියුණු | ADB | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | ඇ.ඩො.මි. 5.00 | රු.මි. 2.5 |

### 1.3.3 ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය (වරාය අංශය) 2024.01.01. – 2024.12.31

| ආයතනය | ප්‍රසම්පාදනය / ව්‍යාපෘතිය | ප්‍රසම්පාදන ක්‍රමවේදය | කොන්ත්‍රාත්තුවේ පිරිවැය /වටිනාකම වැට් රහිත (රු.මිලියන ) |
|---|---|---|---|
| වෙළඳ නාවික ලේකම් කාර්යාලය | ශ්‍රී ලංකා ධජය යටතේ නෞකා ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කිරීම | ජාත්‍යන්තර තරඟකාරී ලංසු (ICB) | අදාල නොවේ |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | නැගෙනහිර බහළු පර්යන්තයේ සවිකර ඇති නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර (STS Cranes) තුනක් (03) (J-17, J-18, J-19) ජය බහළු පර්යන්තයේ අදියර -V වෙත ගෙන යාම. | ජාත්‍යන්තර තරඟකාරී ලංසු (ICB) | ඇ.එ.ජ.ඩො. 1,220,000 + ශ්‍රී ලංකා රු. 379,791,823.53 ( exch.rate 1 USD = ශ්‍රී ලංකා රු. 321.94865 ලංසු විවෘත කිරීමේ දිනට ) කොන්ත්‍රාත්තුවේ පිරිවැය ශ්‍රී ලංකා රු. 772,569,176.53<br>**මුළු අගය - රු.මි. 772.569** |
| | කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II - අංගන ප්‍රදේශයේ පස සවිමත් කර වැඩිදියුණු කිරීමේ අනපේක්ෂිත අතිරේක කාර්යයන් ඉටු කිරීම - සිවිල් වැඩ | වෙනත් (තෝරාගත් ලංසුකරුවන් ගෙන් යෝජනා ලැබී ඇත) | ශ්‍රී ලංකා රු. 611,010,653.748<br>**මුළු අගය - රු.මි. 611.010** |
| සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 2023-2024 දක්වා වූ වර්ෂ තුළ ලංකා නැව් සංස්ථාවට අයත් වියළි තොග ප්‍රවාහන යාත්‍රා සේවයෙහි යෙදවීම. | ජාත්‍යන්තර තරඟකාරී ලංසු (ICB) | කුලී පදනම මත ලබා දී ඇති වටිනාකම දිනකට එක් නැවක් සඳහා<br>**ඇ.එ.ජ.ඩො. 18,217/-** |

## 1.4 විගණන අංශය

### 1.4.1 ඉටුකළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය

- නාස්තිය සහ ඌණ උපයෝජනය වැලක්වීම අනාවරණය කර ගැනීමට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය ඇගයීම.
- වැඩ ක්‍රියාත්මක කිරීමට තුඩුදෙන ගැටළු හඳුනාගැනීම සහ ඊට පිළියම් සෙවීම.
- වත්කම් ආරක්ෂා කිරීම සහ පිරිමැස්මෙන් යුතුව භාවිතා වන්නේදැයි පරීක්ෂා කිරීම.
- වත්කම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර ඇගයීම.
- කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම

- අභ්‍යන්තර සෝදිසි සහ පාලන ක්‍රමය සාර්ථකව සැලසුම් කර ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම.
- භාවිතා කරනු ලබන ගිණුම් පිළිවෙත මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම, එහි වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම.
- වැඩ යෝජනා ක්‍රම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය.
- ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම.
- ආයතන සංග්‍රහය, චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, පිළිපදිනු ලැබේදැයි සොයාබැලීම.
- අවශ්‍ය අවස්ථාවල විශේෂ විමර්ශන පැවැත්වීම.

### 1.4.2 විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ විස්තර

| රැස්වීම් වාරය | දිනය | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත වාර්තාව ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| පළමු | 2024.02.28 | 2024.06.19 |
| දෙවන | 2024.06.26 | 2024.10.24 |
| තෙවන | 2024.10.29 | පිළියෙල කරමින් පවතී |

### 1.4.3 කාර්තුමය ප්‍රගති වාර්තාවන් විගණන සහ කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ දිනයන්

| කාර්තුව | දිනය |
|---|---|
| පළමු | 2024.04.19 |
| දෙවන | 2024.07.15 |
| තෙවන | 2024.10.14 |
| සිව්වන | පිළියෙල කරමින් පවතී |

### 1.4.4 2024.12.31 වන දිනට සිදුකරන ලද විගණන විමසුම්

| අංකය | ඉදිරිපත්කරන ලද විගණන විමසුම් පිළිබඳ විස්තර | | |
|---|---|---|---|
| | දිනය | විෂය | ආයතනය |
| 01 | 2024.02.02 | ගුවන්තොටුපල සේවා අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී සිදු වූ බවට ප්‍රකාශිත අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදු කල අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව (විශේෂ විමර්ශන) | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම |
| 02 | 2024.02.21 | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු කරන ලද සම්බන්ධතාවය පිළිබඳව අනුකූලතව්‍ය යන මැයෙන් යොමු වී | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | | ඇති පෙත්සම සම්බන්ධයෙන් සිදු කල අභ්‍යන්තර පරීක්ෂණ වාර්තාව (විශේෂ විමර්ශන) | |
| 03 | 2024.03.14 | ගිනි අංශ නායක තනතුර ලබා දීමේ නාම ලේඛනයේ නුසුදුස්සන් ඇතුලත් වීම සම්බන්ධව අගතියට පත් පොරොත්තු ලේඛනයේ පිරිස විසින් කල පැමිණිලි සම්බන්ධයෙන් සිදු කල අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව (විශේෂ විමර්ශන) | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම |
| 04 | 2024.03.28 | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ ගුවන්තොටුපල සේවා අධිකාරී තනතුරට උසස් කිරීම පිළිබඳ විගණන වාර්තාව | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම |
| 05 | 2024.03.28 | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ ගිනි අංශ නායක තනතුරට උසස් කිරීම පිළිබඳ විගණන පරීක්ෂණ වාර්තාව | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම |
| 06 | 2024.04.29 | නිලධාරීන් පිරිසක් විසින් ආයතනික වගකීම් නොසලකා හරිමින් තම අභිමතය පරිදි Dev Marine Agencies (Pvt) Ltd ආයතනයේ ව්‍යාපාර කටයුතු වෙනත් තෙවන පාර්ශවීය ආයතනයක් වෙත යොමු කිරීම සමබන්ධයෙන් කල පැමිණිලි අනුව සිදු කල පරීක්ෂණ වාර්තාව (විශේෂ විමර්ශන) | වෙළඳ නාවික ලේකම් කාර්යාලය |
| 07 | 2024.06.05 | පාලන අංශයේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධයෙන් සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව | වරාය,නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 08 | 2024.06.20 | මධ්‍යම මුළුතැන්ගෙවල් අංශයට සහල් සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ජය ට්‍රේඩස් ආයතනය විසින් සිදු කල පැමිණිල්ල පිළිබඳ සිදු කල විගණන පරීක්ෂාව (විශේෂ විමර්ශන) | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 09 | 2024.07.05 | වරාය සේවකයින්ගේ ආරක්ෂාව නොසලකමින් ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝණය කර ආරක්ෂිත සපත්තු මිලදී ගැනීමට පවතින සුදානම වලක්වන ලෙස කල ඉල්ලීම සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂණ වාර්තාව (විශේෂ විමර්ශන) | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 10 | 2024.08.09 | 2023.12.31 දිනෙන් අවසන් මුල්‍ය වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ අභ්‍යන්තර විගණන විගණන නිරීක්ෂණ වාර්තාව | වරාය,නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 11 | 2024.09.30 | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ගෙවීම් වවුචර් පිළිබඳ සිදු කල අභ්‍යන්තර විගණන වාර්තාව | වෙළඳ නාවික ලේකම් කාර්යාලය |
| 12 | 2024.12.30 | 2024 වර්ෂයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්යසාධනය පිළිබඳ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ වාර්තාව | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය |

# 1.5 ගුවන්සේවා අංශය

## 1.5.1 ඉටුකළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය

- ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදු කිරීම.
- ගුවන්තොටුපල මඟින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම.
- ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමග ගිවිසුම් වලට එළඹීම ඇතුළුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාල ප්‍රවර්ධනය හා නියාමනය.
- ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම.
- දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම.
- පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය.
- ගුවන් යානා ලියාපදිංචි කිරීම.
- සිවිල් ගුවන්සේවා අධිකාරිය, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ එහි පාලිත සමාගම් අධීක්ෂණය කිරීම සහ විෂය කටයුතු.

## 1.5.2 ද්විපාර්ශ්වික සබඳතා

### 1.5.2.1 අමාත්‍ය මණ්ඩල සංදේශ

- ✓ 2024 ජනවාරි 29 දිනැති කැබිනට් තීරණයට බලාත්මක වී ඇති ශ්‍රී ලංකා රජය සහ තායිලන්ත රාජධානියේ රජය අතර සංශෝධිත ගුවන් සේවා ගිවිසුම (ASA) අත්සන් කිරීමට එකඟතාව සහ අනුමැතිය 2024.02.03 ලබා දී ඇත. ඉහත සඳහන් කළ ගිවිසුම 1950 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය සහ තායිලන්ත රාජධානියේ රජය අතර පළමු වරට බලාත්මක වූයේය.
- ✓ ශ්‍රී ලංකා රජය සහ ඊශ්‍රායල් රාජ්‍ය රජය අතර පවතින ගුවන් ප්‍රවාහන ගිවිසුමේ සංශෝධන පිළිබඳ ප්‍රොටෝකෝලය 2024 පෙබරවාරි 15 වැනි දින කොළඹදී දෙපාර්ශවයේම පිළිගත් නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් අත්සන් කරන ලදී .
- ✓ ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු රජය අතර 2007.05.22 දින කැන්බරා හි අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම (MoU) සහ 2013.11.26 දින සිට බලාත්මක වූ දෙරට අතර ඉහත ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම (ASA) ගිවිසුමෙහි සාකච්ඡා වාර්තාවක් 2024.02.07 දින දෙරට අතර අතථ්‍ය ආකාරයෙන් පැවත්වනු ලැබූ සාකච්ඡාවේ දී අත්සන් කරන ලදී.

### 1.5.2.2 ගුවන් සමාගම් නම් කිරීම

- ✓ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් (SLA) සහ එතිහාඩ් එයාර්වේස් (Etihad Airways) විසින් ඉල්ලා ඇති කොළඹ සහ මොස්කව් - අබුඩාබි හරහා (Codeshare) කේත බෙදාගැනීමෙන් ගුවන් ගමන් කිරීම සඳහා තාවකාලිකව අවසර ලබා දී ඇත.

- ✓ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් සහ කටාර් එයාර්වේස් දෝහා හරහා කොළඹ සහ මොස්කව් අතර ඉල්ලා ඇති කේත හුවමාරුව සඳහා තාවකාලිකව අවසර ලබා දී ඇත.
- ✓ රුසියාව -ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම යටතේ 04 වැනි වගන්තියට අනුව රුසියානු සමූහාණ්ඩුවේ නගර කිහිපයක මගීන්, ගමන් මලු, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය සඳහා නිතිපතා ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම් සිදු කිරීම සඳහා 'Azur Air' නම් කරන ලදී .
- ✓ ශ්‍රී ලංකා සහ ඉරාන රජයන් අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම )MoU) සහ ගුවන් සේවා ගිවිසුම (ASA) ප්‍රකාරව ඉරාන් එයාර් ටුවර් (Iran Air tour) වරලත් සහ භාණ්ඩ ගුවන් ගමන් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා නම් කරන ලදී .
- ✓ ලියාපදිංචි ගුවන් සේවයක් වන බීබීඑන් (BBN) එයාර්ලයින්ස් වරලත් වැඩසටහනක් මඟින් කොළඹ සිට මාලදිවයින දක්වා භාණ්ඩ මෙහෙයුම් කිරීමට 2024 නොවැම්බර් 30 දක්වා දිනකට එක් ගුවන් ගමනක් වන පරිදි ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

**1.5.2.3 ගුවන් මාර්ග සහ පස්වන නිදහසේ අයිතිවාසිකම්**

- ✓ ශ්‍රී ලංකාව සහ චීනයේ තෝරාගත් ස්ථාන අතර 05 වන ගුවන් නිදහස් අයිතීන් සඳහා අනුමැතිය ෆ්‍රීඩම් ඔෆ් එයාර් සීෂෙල්ස් ගුවන්සේවයට තාවකාලික පදනමින් ලබා දී ඇත.
- ✓ මොස්කව් -කොළඹ මාර්ගය අතර යාම් සහ ඒම් සඳහා Rossiya Airlines (Operating Partner) වලට සහ Aeroflot Russian Airlines (Marketing Partner) විසින් ඉල්ලුම් කරන ලද Codeshare කේත ගිවිසුම්ට ශ්‍රී ලංකා රජයේ (GoSL) අනුමැතිය ලබා දී ඇත.
- ✓ MLE - CMB v.v මත තුර්කි ගුවන් සේවය සඳහා තාවකාලිකව පස්වන නිදහස් ගමනාගමන හිමිකම් අනුමැතිය ලබා දී ඇත.
- ✓ ශ්‍රී ලංකා රජය සහ රුසියානු රජය අතර ගුවන් සේවා ගිවිසුමේ 3 වැනි වගන්තිය අනුව JSC Red Wings (Red Wings Airlines) සතියකට ගුවන් ගමන් වාර 3, 6 සහ 7 බැගින් කොළඹ සිට රුසියාවේ විවිධ මාර්ග 13ක මගීන්, භාණ්ඩ, ගමන් මලු සහ තැපැල් සඳහා නියමිත ජාත්‍යාන්තර ගුවන්සේවා සිදු කිරීමට නම් කර ඇත.
- ✓ ගල්ෆ් ගුවන් මෙහෙයුම් සඳහා පස්වන නිදහස් ගමනාගමන අයිතීන් භාවිතා කිරීමට CMB/MLE v.v සඳහා තාවකාලිකව අනුමැතිය ලබා දී ඇත.
- ✓ JSC Red Wings (Red Wings Airlines) මගින් නිතිපතා ජාත්‍යන්තර ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමට, සතියකට 7 වතාවක් ගුවන් ගමන් වාර සංඛ්‍යාත සහිතව Mineralnye Vody-Mattala අතර මාර්ගය හරහා මගීන්, භාණ්ඩ, ගමන් මලු සහ තැපැල් සඳහා නිත්‍ය ජාත්‍යාන්තර ගුවන් සේවා පැවැත්වීමට අනුමැතිය ලබා දී ඇත.

**1.5.2.4 ජෛවමිතික පුද්ගලික දත්ත එකතු කිරීම**

- ✓ රුසියානු බලධාරීන් විදේශ පුරවැසියන් සහ රාජ්‍ය විරහිත පුද්ගලයන් ඇතුළුවීම සහ පිටවීම පාලනය කරන නීති සහ කොන්දේසි පරීක්ෂා කිරීම සඳහා අත්හදා බැලීමක් සැලසුම් කළේය.

**1.5.2.5 මියන්මාරයට ඇතුළු වන සංචාරකයින් සඳහා මහජන සෞඛ්‍ය අවශ්‍යතා**

- ✓ මියන්මාරයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කර ඇති පරිදි, ජාත්‍යාන්තර ගුවන්තොටුපළ, වරාය සහ දේශසීමා හරහා මියන්මාරයට ඇතුළු වූ සංචාරකයින් සඳහා නවදිල්ලියේ මියන්මාර සංගමයේ, ජනරජ තානාපති කාර්යාලය විසින් PHR යවන ලදී.

**1.5.2.6 ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන (BPC) හත්වැනි වටය**

- ✓ මගී සේවාවල සංඛ්‍යාත වැඩි දියුණු කිරීම සඳහා යෝජිත /ශ්‍රී ලංකාවට පකිස්තාන ගුවන් සේවය (PIA) ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට ඉල්ලීම /මෙහෙයුම් සඳහා (MRIA) ලබා දී ඇති විවෘත අහස (Open Skies) භාවිතා කිරීම ගැන සලකා බලන ලෙස පාකිස්තානයෙන් ඉල්ලීමක් කිරීම /පාකිස්තාන සිසුන්ට ගුවන් සේවා ආශ්‍රිත පුහුණු පහසුකම් ලබා ගැනීම සඳහා සහ කරච්චි සහ ලාහෝර් අතර සම-පර්යන්ත අයිතිවාසිකම් ඇතුළත් කිරීමට ඉල්ලීම.

**1.5.2.7 ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව සඳහා වූ ශ්‍රී ලංකා තුර්කියේ ඒකාබද්ධ කොමිෂමේ (JCETC) 03 වැනි සැසිවාරය.**

- ✓ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව සඳහා වූ ශ්‍රී ලංකා තුර්කියේ ඒකාබද්ධ කොමිෂම (JCETC) යනු අමාත්‍ය මට්ටමේ රැස්වීමකි .පස්වන නිදහස් ගමනාගමන අයිතිවාසිකම් තාවකාලිකව අනුමත කරන ලද අතර දැනට දෙරට අතර ASA යටතේ ඇති සාකච්ඡාවලදී රේගු බදු නිදහස් කිරීම පිළිගෙන ඇත.

**1.5.2.8 ආසියා පැසිෆික් අමාත්‍ය සමුළුව (නව දිල්ලිය 11-12 සැප්තැම්බර් 2024)**

- ✓ සිවිල් ගුවන් සේවා පිළිබඳ දෙවන ආසියා පැසිෆික් අමාත්‍ය සමුළුව සඳහා ICAO ආරාධනය ශ්‍රී ලංකාවට ලැබුණි (නවදිල්ලි, ඉන්දියාව, 2024 සැප්තැම්බර් 11-12). APMC 2024 සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකාවෙන් නියෝජිතයින් දෙදෙනෙකු නම් කරන ලදී.

**1.5.2.9 03 වන සහ 04 වන ආසියා සහයෝගිතා සංවාදය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සම්බන්ධය -අතථ්‍ය ආකාරයෙන්**

- ✓ 2021 නොවැම්බර් 17 දින සම්මත කරන ලද ACD සැලැස්ම 2021-2030 රාමුව තුළ ආසියා සහයෝගිතා සංවාදයේ (ACD) සම්බන්ධතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGC) ආරම්භ කිරීම ආරම්භ කරන ලදී .WGC හි සාකච්ඡා සංසදයට අමාත්‍යාංශය සහ එහි විෂය පථය ආයතන සහභාගී විය.

**1.5.2.10 ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (FTA) ආර්ථික සහයෝගිතා පරිච්ඡේදය ක්‍රියාත්මක කිරීම**

- ✓ ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) ලිමිටඩ් සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් යන සමාගම්වල යෝජනා නිදහස් වෙළඳ ගිවිසුමට ඇතුළත් කිරීමට ඉදිරිපත් කර ඇත.

**1.5.2.11 ශ්‍රී ලංකා -තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) ක්‍රියාත්මක කිරීම**

- ✓ ශ්‍රී ලංකාව සහ තායිලන්තය දැනට පවතින ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම (ASA) යටතේ විවෘත අහස (Open Skies) ගිවිසුමක් පවත්වාගෙන යන අතර එමඟින් දෙරට අතර ගුවන් ගමන් සීමා රහිතව ගමන් කිරීමට ඉඩ සලසයි. මේ යටතේ දැනට ශ්‍රී ලංකන් ගුවන් සමාගම කොළඹ සහ බැංකොක් අතර සතිපතා ගුවන් ගමන් 11ක් ක්‍රියාත්මක කරයි.

### 1.5.2.12 භූතානය සහ ශ්‍රී ලංකාව අතර විදේශ ලේකම් මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන (BPC) දෙවන වටය

- ✓ දෙරට අතර ද්විපාර්ශ්වික සහ දේශපාලන සහයෝගීතාව ශක්තිමත් කිරීමේ අරමුණින් BPC වැඩසටහනේ 02 වැනි වටය නොවැම්බර් මාසයේදී තිම්පුහිදී පැවැත්විණි.

**ද්විපාර්ශ්වික සාකච්ඡා නියෝජිතයින්ගේ රැස්වීමේදී පසු විපරම් කිරීමට නියෝග කර ඇති කරුණු***

01. හංගේරියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර 2014 දී ආරම්භ කරන ලද සංශෝධිත ගුවන් සේවා ගිවිසුම (ASA) අත්සන් කිරීම සඳහා නව කැබිනට් අනුමැතියක් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ (AGD) සමාලෝචනය.

02. 2024.04.29 දිනැති කැබිනට් තීරණයට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රජය සහ කසකස්තාන් ජනරජය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම ආරම්භ කිරීම.

03. ගුවන්සේවා සඳහා තුන්වන පාර්ශ්ව කේත බෙදාගැනීමේ (Codeshare) අයිතිවාසිකම් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් විධිමත් සම්ප්‍රේෂණයක් සමාලෝචනය කිරීම.

04. කොළඹ සහ චීනයේ තෝරාගත් ගමනාන්ත අතර ගුවන් සීෂෙල්ස් නිදහස් ගමනනාගමන අයිතීන් අනුමැතිය සඳහා (GoSL) ද්විපාර්ශ්වික කණ්ඩායම් සාකච්ඡාකරුවන් වෙතින් සමාලෝචනය/අනුමත කිරීම.

05. රුසියානු සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකාව අතර සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම සහ රුසියානු සමූහාණ්ඩුවේ Vnukovo ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත ගුවන් ගමන් වැඩසටහන ආරම්භ කිරීම.

06. ආර්මේනියාව සහ ශ්‍රී ලංකාව අතර නියමිත මෙහෙයුම් සඳහා FITS Air නම් කිරීම.

07. මියන්මාරයේ අදාළ රාජ්‍යතාන්ත්‍රික නාලිකාවලින් ලැබුණු එකඟතාවයෙන් පසු ශ්‍රී ලංකාව සහ මියන්මාරය අතර ගුවන් සම්බන්ධතාව ආරම්භ කිරීම.

08. තුර්කි රජය සහ ශ්‍රී ලංකාව අතර 2008.12.02 දින අත්සන් කරන ලද සංශෝධිත ප්‍රොටෝකෝලය ද්විපාර්ශ්වික ගුවන් ප්‍රවාහන ගිවිසුම ආරම්භ කිරීම.

09. Guangzhou ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ අතර වරලත් පියාසැරි මෙහෙයුම් ආරම්භ කිරීම (හයිනන් ගුවන් සේවය විසින් යෝජිත මෙහෙයුම් CAN - HRI - CAN මාර්ගයේ මෙහෙයුම් ආරම්භ කිරීම).

10. හංගේරියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමක් ආරම්භ කිරීම.

11. ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර ක්‍රියාත්මක වන ගුවන් යානා සඳහා ස්කයි මාෂල්වරුන් යෙදවීම සඳහා අවබෝධතා ගිවිසුමක් (MoU) ආරම්භ කිරීම.

12. ශ්‍රී ලංකාව සහ කැරිබියන් කලාපය අතර ගුවන් සම්බන්ධතාව ස්ථාපිත කිරීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම .

13. ඉන්දියාව සමඟ පවතින ගුවන්සේවා ගිවිසුම (ASA) යටතේ ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකාවේ ගුවන්සේවයක් ලෙස නැවත නම් කිරීමට අනුමැතිය ඉල්ලීම.

14. ශ්‍රී ලංකා රජය සහ ඉතියෝපියාව අතර යෝජිත ගුවන් සම්බන්ධතාව.

15. ශ්‍රී ලංකා රජය සහ Türkiye රජය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම (BASA) සංශෝධනය කිරීමේ ප්‍රොටෝකෝලය සම්බන්ධයෙන් නැවත ක්‍රියා කිරීම (2008 දෙසැම්බර් 2 දින අත්සන් කරන ලදි).

16. ශ්‍රී ලංකා සහ ඔස්ට්‍රියාවේ රජයන් අතර ඇතිකරගත් ගුවන් සේවා ගිවිසුමට අනුව ශ්‍රී ලංකාව සහ ස්ලෝවේනියාව අතර ගුවන් ගමන් ආරම්භ කිරීමට පහසුකම් සැලසීම.

17. Jetstar Asia Airways Private Limited සහ Scoot Private Limited සිංගප්පූරුවේ නම් කරන ලද ගුවන් සේවය ලෙස නම් කිරීමට ඉල්ලීම.

18. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය නංවාලීම සඳහා රුසියානු වරලත් ගුවන් සේවාව දිරිමත් කිරීම.

19. ශ්‍රී ලංකා රජය සහ බල්ගේරියාවේ රජය අතර නව ගුවන් ප්‍රවාහන ගිවිසුමකට අත්සන් තැබීමේ යෝජනාව.

20. මාලදිවයින් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය අතර සෙවීම් සහ මුදාගැනීමේ (SAR) ගිවිසුම.

21. 1996 දී අත්සන් කරන ලද ගුවන් සේවා ගිවිසුමේ 15 වැනි වගන්තියට අනුව අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම.

**සියලු ඉල්ලීම් තවදුරටත් ප්‍රගතිය සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් අදාළ බලධාරීන් වෙත යොමු කර ඇත**.

## 1.5.3 නිෂ්කාශනය සහ වීසා නිර්දේශ සහ විදේශ නිවාඩු අනුමැතිය

### 1.5.3.1 ආරක්ෂක නිෂ්කාශනය

| ශ්‍රීලංකන් ගුවන් සමාගම | | | | |
|---|---|---|---|---|
| අංකය | සේවාව | නිෂ්කාශනය ගණන | ලැබී තිබෙන | අදහස් |
| 01 | කාර්ය මණ්ඩලය | 693 | 688 | 05 නිෂ්ප්‍රභා |
| 02. | මැදිරි කාර්ය මණ්ඩලය | 45 | 45 | - |
| 03. | ප්‍රධාන ගුවන් නියමුවන්<br>කණිෂ්ඨ ගුවන් නියමුවන්<br>සහයක ගුවන් නියමුවන් | 07<br>14<br>03 | 07<br>14<br>03 | -<br>-<br>- |
| **සිවිල් ගුවන්සේවා අධිකාරිය** | | | | |
| 01. | ගුවන් නියමුවන් | 210 | 757 | 2023 ප්‍රමාද වූ නිෂ්කාශන ද ලැබී ඇත |
| 02. | සේවකයන් | 163 | | |

### 1.5.3.2 විදේශ නිවාඩු අනුමැතිය

| ශ්‍රීලංකන් ගුවන් සමාගම | | |
|---|---|---|
| නිවාඩු වර්ගය | | ලැබී ඇති ඉල්ලුම්පත් ප්‍රමාණය |
| 01. | රාජකාරී විදේශ ගමන් නිවාඩු | 205 |
| **ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම** | | |
| 01. | රාජකාරී විදේශ ගමන් නිවාඩු | 84 |
| 02. | පෞද්ගලික විදේශ ගමන් නිවාඩු | 38 |
| **සිවිල් ගුවන්සේවා අධිකාරිය** | | |
| 01. | රාජකාරී විදේශ ගමන් නිවාඩු | 36 |

## 1.5.4 ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය (සිවිල් ගුවන්සේවා අංශය) 2024.01.01. – 2024.12.31

ගුවන් සේවා අංශයට අදාල ප්‍රසම්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවල කටයුතු සම්බන්ධීකරණය, ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීම, කැබිනට් පත්‍රිකා සැකසීම, කැබිනට් තීරණ සන්නිවේදනය සහ ප්‍රසම්පාදන පිරිනැමීමට අදාල පසු විපරම සිදු කිරීම. (2024 වර්ෂයට අදාලව මෙහෙය වූ ප්‍රසම්පාදන හා සංවර්ධන ව්‍යාපෘති ගණන පහත වගුවේ දැක්වේ.)

| | ආයතනය | SCAPC | MPC | CANC | CPCM | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය | - | - | - | - | - |
| 02 | ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 18 | 20 | 06 | 01 | 05 |
| 03 | සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම | 28 | 28 | - | - | - |

2024 වර්ෂයේදී ඉහත ආයතන 03 ට අදාලව සිදු කෙරෙනු ලැබූ ප්‍රසම්පාදන හා ව්‍යාපෘති පිරිනැමීම සඳහා අදාල ප්‍රසම්පාදන කමිටුවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පහත පරිදි ලබා දී ඇත.

| ප්‍රසම්පාදනය / ව්‍යාපෘතිය | ප්‍රසම්පාදන ක්‍රමවේදය | කොන්ත්‍රාත්තුවේ පිරිවැය /වටිනාකම (රු.මිලියන ) |
|---|---|---|
| **ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම** | | |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පිටත්වන මඟීන් රැඳී සිටීමේ, මඟීන් පරීක්ෂා කිරීමේ හා මඟී පර්යන්තයේ සිට ගුවන්යානා වෙත පිටවීමේ දොරටු වල ධාරිතාවය වැඩිදියුණු කිරීම උදෙසා නව ගොඩනැගිලි ඉදි කිරීම සහ 02 වැනි පැකේජය - පිටත්වීමේ මඟීන්ගේ ගමන්මළු ගෙනයන කරුසලය නැවත සකස් කිරීම, අලුත්වැඩියාව, හා දිගු කිරීම ආශ්‍රිත සිවිල් ඉංජිනේරු කටයුතු. | මිල ලංසු කැඳවීම (ICB) | 852.2 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ (BIADP) II වන අදියර 2 වන පියවර යටතේ 'A' පැකේජය - මඟී පර්යන්ත ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත කාර්යය - සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම; ප්‍රධාන පර්යන්ත ගොඩනැගිල්ලේ (MTB) අත්තිවාරම් ශක්තිමත් කිරීමේ කුළුණු, කුළුණු වැස්ම හා බිම් තලාද, මඟී පාලම් 2 හා මඟී පාලම්3 ඇතුළත් ව්‍යාපෘතියේ හඳුනාගත් කාර්යයන් සිදු කිරීම. | මිල ලංසු කැඳවීම (NCB) | 3255.5 |
| ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා අයිතිය පැවරීම (BOT) යන පදනමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි බහු මහල් රථගාල සහ වාණිජ කටයුතු සඳහා ප්‍රදේශයක් ඉදි කිරීම. | යෝජනා කැඳවීම (RFP) | ඇ.ඩො. මිලියන 50 |

| | | |
|---|---|---|
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි පැමිණීමේ ප්‍රදේශයේ රේගු කටයුතු සඳහා වෙන්කර ඇති පෙදෙසේ ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුන්ටර් ක්‍රියාත්මක කිරීම සඳහා සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය. | මිල ලංසු කැඳවීම (LNCB) | 3259.1 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (BIA) පිටත්ව යෑමේ ගමන් මඟෙහි (Departure Walkway) ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුන්ටර් ක්‍රියාත්මක කිරීම සඳහා සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය. | මිල ලංසු කැඳවීම (LNCB) | 2337.5 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිරිපස හිස් ප්‍රදේශයේ (ලොබිය) සංචාර සේවා කවුන්ටර් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය. | මිල ලංසු කැඳවීම (NCB) | 664 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) මෙරටින් පිටත්වීමේ/ නියමිත ගුවන්යානා පැමිණෙන තෙක් මඟීන් රැඳී සිටින ප්‍රදේශයේ තේ අලෙවි කිරීමේ සාප්පු පවත්වාගෙන යෑම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය. | මිල ලංසු කැඳවීම (NCB) | 631.2 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) පැමිණීමේ පර්යන්තය සහ එහි පරිශ්‍රය සඳහා සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සැපයීම. | මිල ලංසු කැඳවීම (NCB) | 323.3 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) පිටත්වීමේ පර්යන්තය සහ එහි පරිශ්‍රය සඳහා සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සැපයීම. | මිල ලංසු කැඳවීම (NCB) | 344.3 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) ජාල පාදක පොදු ලිපින පද්ධතිය සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ නියාමනය කිරීම. | මිල ලංසු කැඳවීම (NCB) | 319.8 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) CCTV පද්ධතිය වැඩිදියුණු කිරීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ කොමිස් කිරීම. | මිල ලංසු කැඳවීම (NCB) | 328.2 |
| කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පැමිණීමේ පර්යන්තයේ/ලොබි ප්‍රදේශයේ හෝටල් සේවා කවුන්ටර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 248 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මහජන පැමිණීමේ පර්යන්තයේ/ලොබි ප්‍රදේශයේ ජංගම සන්නිවේදන සේවා කවුන්ටර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 370 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ කජු වෙළඳසැල් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 205 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ නව ව්‍යාපාර ස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 256.5 |

| | | |
|---|---|---|
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ/සංක්‍රමණ පර්යන්තයේ පුද්ගලික සහ රූපලාවන්‍ය සත්කාරක වෙළඳසැල් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 367 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ සන්නාමගත උපාංග වෙළඳසැල් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 118 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ ජංගම සන්නිවේදන සේවා කවුන්ටර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 218 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ දේශීය ආහාර පාන අලෙවිසැලක් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 209 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ මාර්ගයේ අත්කම්, අත්යන්ත්‍ර, බතික් සහ රෙදිපිළි දේශීය ආහාර පාන අලෙවිසැලක් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 318 |
| කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීම්/සංක්‍රමණ පර්යන්තයේ මැණික් හා ස්වර්ණාභරණ සාප්පු ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම. | මිල ලංසු කැඳවීම (NCB) | 203 |
| **සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම** | | |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, අබුඩාබි ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (AUH) බිම් මෙහෙවර සේවා සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය | 787.48 |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවය සඳහා ඉන්දියාවේ මදුරෙයි ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (IXM) බිම් මෙහෙවර සේවා කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | මිල ලංසු කැඳවීම (LIB) | 663 |
| ශ්‍රීලන්කන් ගුවන් සේවය සඳහා එක්සත් රාජධානියේ, ලන්ඩන් හීත්‍රෝ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (LHR) බිම් මෙහෙවර සේවා සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | මිල ලංසු කැඳවීම (LIB) | 3409 |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සම්බන්ධක නැවතුම් සේවා (Connecting Point Services) සඳහා මෙහෙයුම් හැසිරවීමේ නියෝජිතවරයෙකු තෝරාගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම (වසර 03ක කාල සීමාවක් සඳහා ගුවන් ගමන් කාලය තුළ තාවකාලික නැවතුම් පිළිබඳ වැඩසටහන - Layover Programme) | මිල ලංසු කැඳවීම (NCB) | 3340 |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ස්වයංක්‍රීය ආකාරයෙන් ඉහළ පෙළ ආසන වෙන් කිරීම සඳහා ලංසු තැබීමේ සේවා (Automated Seat Upgrade Bidding Services) සහ ඒ ආශ්‍රිත අනුයාත සේවා (Associated Ancillary Services) සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම | මිල ලංසු කැඳවීම (ICB) | 3662.18 |
| ජපානයේ, ටෝකියෝ - නරිටා ගුවන් තොටුපළෙහිදී (NRT) ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ බිම් මෙහෙවර සේවා සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය | 1442.21 |

| | | |
|---|---|---|
| නව්‍ය ප්‍රවේශයක් සමඟින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ ගුවන්යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම. | කල්බදු | |
| සෞදි අරාබියේ දම්මාම් (DMM), ජෙඩාහ් (JED) හා රියාද් (RUH) ගුවන් තොටුපළවල්හි දී ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ මඟීන් සහ ජංගම සෝපාන සේවා සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | මිල ලංසු කැඳවීම (LIB) | 2043.87 |
| චීනයේ ගුවැන්ග්සෝ (CAN) ගුවන් තොටුපළ දී ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ මඟීන් සහ ජංගම සෝපාන සේවා සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | මිල ලංසු කැඳවීම (LIB) | 1001.29 |
| ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ගුවන්යානා ඇණිය සඳහා අධිවේගී චන්ද්‍රිකා තාක්ෂණික අන්තර්ජාල සම්බන්ධතාවයක් සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම. | සෘජු කොන්ත්‍රත් ක්‍රමය | 1658.88 |
| ලොව පුරා ස්ථාන (ගුවන්තොටුපොළ) 04 කදී ශ්‍රීලන්කන් ගුවන්සේවය සඳහා ගුවන්යානා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම. | මිල ලංසු කැඳවීම (LIB) | 35,973 |
| A320 මාදිලියේ ගුවන් යානාවක (MSN 4694) කල්බදු කාලසීමාව දීර්ඝ කිරීම. | කල්බදු | |
| කැන්ටන්හි පියාසර කාර්ය මණ්ඩලය සහ මැදිරි කාර්ය මණ්ඩලය සඳහා හෝටල් නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් සැපයීම. | මිල ලංසු කැඳවීම (ICB) | 307 |
| ජෙඩා හි ගුවන් යානා කාර්ය මණ්ඩලය සහ මැදිරි කාර්ය මණ්ඩලය සඳහා හෝටල් නවාතැන් සහ ප්‍රවහන පහසුකම් සැපයීම. | මිල ලංසු කැඳවීම (ICB) | 464 |
| ජපානයේ නරිටා ගුවන්තොටුපොළේ හි ගුවන් යානා සඳහා විධිමත් ලෙස ආහාර සැපයීමේ ක්‍රියාවලිය සඳහා ආහාර සපයන්නෙකු තෝරා ගැනීම. | මිල ලංසු කැඳවීම (ICB) | 353 |
| පැරිසියේ පියාසර කාර්ය මණ්ඩලය සහ කැබින් කාර්ය මණ්ඩලය සඳහා හෝටල් නවාතැන් සැපයීම. | මිල ලංසු කැඳවීම (ICB) | 441 |
| ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (FRA) ගුවන් යානා සඳහා විධිමත් ලෙස ආහාර සැපයීමේ ක්‍රියාවලිය සඳහා ආහාර සපයන්නෙකු තෝරා ගැනීම | මිල ලංසු කැඳවීම (ICB) | 285 |
| අධිනඩත්තු කටයුතු ඉටුකිරීම සඳහා සුදුසුකම් ලත් නඩත්තු, අළුත්වැඩියා හා තත්වය පිරික්සීමේ කොන්ත්‍රත්තුව සඳහා තොරා ගැනීම. | යෝජනා කැඳවීම (RFP) | 345 |
| ශ්‍රීලන්කන් ගුවන් සමගමේ Trent 700 වර්ගයේ එන්ජිමක් (ESN 41109) නඩත්තු, අළුත්වැඩියා හා තත්වය පිරික්සීමේ කොන්ත්‍රත්තුව සඳහා තොරා ගැනීම. | යෝජනා කැඳවීම (RFP) | 365 |
| ශ්‍රිලන්කන් ගුවන් සමගමේ Trent 700 වර්ගයේ එන්ජිමක් නඩත්තු, අළුත්වැඩියා හා තත්වය පිරික්සීමේ කොන්ත්‍රත්තුව සඳහා තොරා ගැනීම. | යෝජනා කැඳවීම (RFP) | 450 |

# II කොටස

# 2. වෙළඳ නාවික ලේකම් කාර්යාලය


වෙළඳ නාවික ලේකම් කාර්යාලය මඟින් මුහුදේ සැරිසරන ජීවිතවල සහ දේපළවල ආරක්ෂාව, සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව, ප්‍රවීණත්වය ඇගයීමෙන් පසු සහතික දීම, ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම, නැව් එජන්තවරුන්ට, බහළුම් මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්ට, බහළුම් පර්යන්ත මෙහෙයුම්කරුවන්ට, බහළුම් නැව් බඩු මෙහෙයුම්කරුවන්ට, නැව් බඩු ඉදිරිපත් කරන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවෙකු නොවන පොදු ප්‍රවාහකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ අදාළ වන සියලු ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මකවීම පිළිබඳ වගකීම දරයි.

## 2.1 මෙහෙයුම් ප්‍රගතිය

### 2.1.1 සහතිකපත් නිකුත්කිරීම - 2024

#### 2.1.1.1 අඛණ්ඩ මුදාහැරීමේ සහතිකය (CDC)

| මාසය | නව CDC සංඛ්‍යාව | යාවත්කාලීන කල CDC සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 229 | 230 |
| පෙබරවාරි | 312 | 259 |
| මාර්තු | 255 | 217 |
| අප්‍රේල් | 227 | 183 |
| මැයි | 267 | 223 |
| ජූනි | 249 | 216 |
| ජූලි | 402 | 263 |
| අගෝස්තු | 305 | 237 |
| සැප්තැම්බර් | 187 | 252 |
| ඔක්තෝබර් | 272 | 277 |
| නොවැම්බර් | 202 | 227 |
| දෙසැම්බර් | 386 | 234 |
| **එකතුව** | **3293** | **2818** |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

#### 2.1.1.2 ප්‍රවීණතා සහතික/මුරකාවලෙහි යෙදවීමේ සහතික සංඛ්‍යාව

**I. නාවික අංශය**

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| නැව්පති (1 වන පන්තිය) | 28 |
| නැව්පති නිලධාරී (2 වන පන්තිය) | 36 |
| නැව්පති නිලධාරී (3 වන පන්තිය) | 85 |
| ජලතරණ /මුරකාවල් සහතික (නිලධාරී / නිලධාරී නොවන) | 915 |
| නිපුණතා සහතික | 393 |

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

II. ඉංජිනේරු අංශය

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | 30 |
| දෙවන ඉංජිනේරු | 36 |
| තෙවැනි ඉංජිනේරු | 84 |
| ඉංජිනේරු /මුරකාවල් සහතික (නිලධාරී / නිලධාරී නොවන) | 223 |
| නිපුණතා සහතික | 109 |

මුලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.2 නැව් ඒජන්තවරුන් බහළුම් මෙහෙයුම්කරුවන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම - 2024

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| නැව් නියෝජිතයන් | 212 |
| බහළු මෙහෙයුම්කරුවන් | 23 |
| නැව් බඩු ගෙනයන්නන් | 476 |
| නැව් බඩු ගෙනයන්නන් හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් | 76 |
| යාත්‍රා නාවික බලපත්‍ර | 563 |
| නැව් සමාගම් එකතු කිරීම | 48 |

මුලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය


## 2.3 බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් නිකුත් කිරීම - 2024

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| පාලම් තරාදි සඳහා (Weigh Bridge) | 32 |
| භාණ්ඩ අපනයනකරුවන් (Shipper) | 66 |
| ප්‍රයිම් මූවර් (Prime Mover) | 03 |
| ට්‍රේලර් (Trailer) | 05 |
| ලොරි රථ ( Lorry) | 01 |

මුලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.4 නාවිකයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම (SID) - 2024

| මාසය | හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 438 |
| පෙබරවාරි | 656 |
| මාර්තු | 528 |
| අප්‍රේල් | 389 |
| මැයි | 449 |
| ජූනි | 340 |
| ජූලි | 467 |
| අගෝස්තු | 436 |
| සැප්තැම්බර් | 239 |
| ඔක්තෝබර් | 373 |
| නොවැම්බර් | 291 |
| දෙසැම්බර් | 307 |
| **එකතුව** | **4913** |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛන, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.5 ආදායම් ප්‍රකාශය - 2024

වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා උපයන ලද මාසික ආදායම් පහත පරිදි වේ.

| **මාසය** | **ආදායම (රු.)** |
|---|---:|
| ජනවාරි | 17,135,845.30 |
| පෙබරවාරි | 16,824,472.29 |
| මාර්තු | 16,371,847.50 |
| අප්‍රේල් | 19,037,273.18 |
| මැයි | 15,129,792.54 |
| ජූනි | 18,651,365.02 |
| ජූලි | 21,989,226.08 |
| අගෝස්තු | 14,105,702.98 |
| සැප්තැම්බර් | 16,332,688.92 |

| | |
|---|---|
| ඔක්තෝබර් | 12,142,363.70 |
| නොවැම්බර් | 24,588,016.18 |
| දෙසැම්බර් | 32,676,214.76 |
| **එකතුව** | **224,984,808.45** |

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.6 ලබා ගත් ජයග්‍රහණ

### 2.6.1 මානව සම්පත් සංවර්ධනය

- 2024 ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 දින දක්වා විදේශීය පුහුණු වැඩසටහන් 09ක් සඳහා නිලධාරීන් 08 දෙනෙකු සහභාගී වී ඇත.
- 2024 ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 දින දක්වා දේශීය පුහුණු වැඩසටහන් 18ක් සඳහා ආයතනයේ නිලධාරීන් සහභාගී වී ඇත.

## 2.7 ඉදිරි සැලසුම්

- IMO හා ILO සම්මුතීන්ට අනුකූලව දේශීය නීතිරීති සකස්කිරිම හා අවශ්‍යතාවය පරිදි යාවත්කාලීන කිරීම.
- ඊ- රාජ්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලාංකා ධජය යටතේ නෞකා ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම.
- නාවිකයන් සඳහා විදේශීය ධජය සහිත නෞකා වල සේවය කිරීමට අවශ්‍ය සමානතා සහතික නිකුත් කිරීම සඳහා සුදුසු විදේශීය රාජ්‍යයන් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- වෙරළාසන්න නාවික කටයුතුවලට අදාල රෙගුලාසි සකස් කිරීම.
- මහජනයා සඳහා විනිවිදභාවයෙන් යුතු කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා තත්ත්ව පද්ධති හඳුන්වාදීම, යාවත්කාලිනකිරීම සහ ප්‍රතිව්‍යුගත කිරීම.
- නාවික ක්ෂේත්‍රයේ නව ගෝලීය ප්‍රවණතාවයන් සඳහා අවශ්‍යවන නීතිරීති ස්ථාපිත කිරීම.

## 2.8 වියදම් වාර්තාව - 2024.12.31 දිනට

336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය

| වැය විෂය | අයිතම විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | මුළු වියදම | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | |
| | **පුද්ගල පඩිනඩි** | | | |
| 1001 | වැටුප් හා වේතන | 32,000,000.00 | 31,663,380.74 | 99% |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,500,000.00 | 1,131,668.44 | 75% |
| 1003 | වෙනත් දීමනා | 28,360,000.00 | 27,716,120.70 | 98% |
| | **ගමන් වියදම්** | | | |
| 1101 | දේශීය | 500,000.00 | 102,615.00 | 21% |
| 1102 | විදේශ | 2,200,000.00 | 1,336,128.76 | 61% |
| | **සැපයීම්** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 18,580,000.00 | 18,569,144.65 | 100% |
| 1202 | ඉන්ධන | 6,000,000.00 | 4,922,084.31 | 82% |
| 002 | ඉන්ධන දීමනාව | 4,000,000.00 | 3,989,308.03 | 100% |
| 009 | සංචිත වාහන සඳහා ඉන්ධන | 1,500,000.00 | 781,051.28 | 52% |
| 010 | වෙනත් කටයුතු සඳහා ඉන්ධන | 500,000.00 | 151,725.00 | 30% |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000.00 | 12,000.00 | 12% |
| 002 | නිල ඇඳුම් | 100,000.00 | 12,000.00 | 12% |
| 1205 | වෙනත් | 200,000.00 | 195,914.20 | 98% |
| | **නඩත්තු වියදම්** | | | |
| 1301 | වාහන | 2,157,000.00 | 2,156,927.00 | 100% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 994,862.71 | 50% |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 294,010.00 | 59% |
| 1304 | මෘදුකාංග නඩත්තු | 4,800,000.00 | 4,754,431.71 | 99% |
| | **සේවා** | | | |
| 1401 | ප්‍රවාහන | 3,625,000.00 | 3,623,580.65 | 100% |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,400,000.00 | 1,203,107.93 | 86% |

| | | | | |
|---|---|---|---|---|
| 1403 | විදුලිය සහ ජලය | 9,220,000.00 | 8,403,724.48 | 91% |
| 1404 | බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | 23,900,000.00 | 23,887,884.23 | 100% |
| 1405 | පිරිසිදු කිරීම් හා පවිත්‍රතා සේවා | 3,000,000.00 | 3,000,000.00 | 100% |
| 1407 | ආරක්ෂක සේවා | 3,600,000.00 | 3,539,326.37 | 98% |
| 1409 | වෙනත් | 2,300,000.00 | 1,197,280.85 | 52% |
| 138 | යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා | 558,000.00 | 94,529.80 | 17% |
| 139 | වාහන රක්ෂණය | 260,000.00 | 258,050.23 | 99% |
| 140 | විවිධ සේවා වියදම් | 1,000,000.00 | 844,700.82 | 84% |
| | **මාරු කිරීම්** | | | |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 11,000,000.00 | 10,718,175.77 | 97% |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොළී | 300,000.00 | 264,987.60 | 88% |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | | | |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000.00 | 63,000.00 | 63% |
| | **පුනරාවර්තන මුළු වියදම්** | | **149,655,806.10** | |
| | **මූලධන වියදම්** | | | |
| | **මූලධන වත්කම් පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000.00 | - | 0% |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000.00 | - | 0% |
| 2003 | වාහන | 200,000.00 | 184,600.00 | 92% |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම්** | | | |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 20,575,000.00 | 20,574,167.45 | 100% |
| | **හැකියා වර්ධනය** | | | |
| 2401 | කාර්යමණ්ඩල පුහුණු | 600,000.00 | 470,770.00 | 78% |
| | **සියලුම සේවාවන් ඒකාබද්ධ කරමින් ඊ-පෘතිය ස්ථාපිත කිරීම ව්‍යාරාජ්‍ය** | | | |
| 2106 | මෘදුකාංග සංවර්ධනය | 20,000,000.00 | - | 0% |
| | **මූලධන මුළු වියදම** | | **21,229,537.45** | |
| | **මුළු වියදම** | | **170,885,343.55** | |

# 3. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකාවේ වරායයන්හි අනාගතය කෙරෙහි අවධානය යොමු කරමින්, අභියෝග මෙන්ම අවස්ථාවන් රාශියකට මඟ සලසන ජාත්‍යන්තර වෙළඳාමේ උත්පාතය අපේක්ෂා කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි විශිෂ්ටතම, බහළු මෙහෙයුම් කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ සිට ගෝලීය වශයෙන් විශිෂ්ටතම සේවා සැපයුම් බවට පත් කිරීමට සුසමාදර්ශී වෙනසක් සිදු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීමෙහිලා, ජාතික හා අන්තර්ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සෑම මට්ටමකින්ම ජාතික සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් මිණුම් සලකුණු කරන අතරම, සියළු තොරතුරු ක්ෂණිකව "එක් ස්පර්ශ" තොරතුරු ප්‍රවාහයක් සමඟින් සිය සංකීර්ණ සැපයුම් ප්‍රවේශයන් ශක්තිමත් කිරීමට වරාය අධිකාරිය සැලසුම් කරයි.

# 3.1 සංවර්ධන ව්‍යාපෘති

## 3.1.1 නැගෙනහිර බහළු පර්යන්තය - අදියර II

### 3.1.1.1 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීම

නැගෙනහිර බහළු පර්යන්තය සඳහා නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 12 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් පිරිසැකසුම් කිරීම සඳහා වන ගිවිසුමට කොන්ත්‍රාත්කරු වන Shanghai Zhenhua Heavy Industries Co. Ltd., සමඟ 2021.12.20 දින අත්සන් තබන ලදී. මෙම කාලසීමාව තුළ රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ලංකා බැංකුව විසින් අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීමෙන් පිරිසැකසුම් වැඩ 2022.12.01 දින ආරම්භ කරන ලදී.

මේ වන විට, පළමු තොගයට නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 06 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 20 ක් ලැබී ඇති අතර, දෙවැනි දොඹකර තොගය ලෙස (නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 03 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 06 ක්) 2025 ජනවාරි මස ලැබීමට නියමිත අතර ඉතිරිය ප්‍රතිශෝධිත උපලේඛනය අනුව 2025 මැද භාගයේදී ලැබීමට නියමිතය. දැනටමත් ලැබී ඇති නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර සවි කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර පෙර භාවිතා කරන ලද රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර හා ප්‍රයිම් මූවර් රථ සමඟ දැනට පවත්නා අංගණය තුළ මෙහෙයුම් සිදු කරනු ලැබේ. නැගෙනහිර බහළු පර්යන්ත ව්‍යාපෘතියේ සිවිල් වැඩ කොන්ත්‍රාත්කරු විසින් නව අංගණයේ ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර සඳහා වන රේල් පීලි සවි කර අවසන් කළ පසු රේල් පීලි මත සවිකර ඇති නව ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර සවි කිරීම පියවරින් පියවර 2025 වසරේ මුල් කාර්තුව තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

2024.12.31 දිනට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති පිරිවැය (රු. මිලියන) | 2024.12.31 දිනට සමුච්චිත භෞතික හා මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (එ.ජ.ඩො. මිලියන) |
| නැගෙනහිර බහළු පර්යන්තය - උපකරණ ප්‍රසම්පාදනය කිරීම - නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 12 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් | එක්සත් ජනපද ඩොලර් මිලියන 282 | 89% (පිරිසැකසුම් - 68%) | එක්සත් ජනපද ඩොලර් මිලියන 183.664 |

### 3.1.1.2 නැගෙනහිර බහළු පර්යන්තය අදියර - II - සිවිල් වැඩ

| අංකය | අපේක්ෂිත ප්‍රතිඵල | භෞතික ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | 2024 වර්ෂය තුළ ප්‍රගතිය | 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය |
| 1 | සාමාන්‍ය අයිතමයන් | 77% | 11% | 88% |
| 2 | හැරීම සහ ගොඩ කිරීම | 67% | 12% | 79% |
| 3 | ජැටි බැම්ම ඉදිකිරීම | 19% | 42% | 61% |
| 4 | ගොඩබිම පැත්තේ සවි කරන ලද දොඹකර බාල්කය | 5% | 22% | 27% |
| 5 | රැඳවුම් බැම්ම ඉදිකිරීම | 0% | 0% | 0% |
| 6 | බහළු අංගණය ඉදිකිරීම | 8% | 23% | 31% |
| 7 | ජල හා ගිනි නිවාරණ සේවා | 0% | 62% | 62% |
| 8 | විදුලි, දත්ත හා සන්නිවේදන පද්ධතිය | 2% | 19% | 21% |
| 9 | වැසි ජලය බැසයාම සඳහා කාණු ඉදිකිරීම | 6% | 18% | 24% |
| | **සමස්ත ප්‍රගතිය** | **25%** | **20%** | **45%** |

### 3.1.1.3 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - සිවිල් වැඩ

ආසන්න වශයෙන් වර්ග මීටර් 4,500 ක වපසරියකින් යුත් තට්ටු හතරක ගොඩනැගිල්ලකි. රුපියල් මිලියන 499 ක ටෙන්ඩරය ASSET-AMSK හවුල් ව්‍යාපාරය වෙත ප්‍රදානය කර ඇත. මෙහි ඉදිකිරීම් වැඩ 2023 ජූනි 21 දින වැඩ ආරම්භ කර ඇති අතර 97% ක පමණ වැඩ නිම කොට ව්‍යාපෘතිය අවසන් කිරීමට ආසන්නව පවතී. වහල ටෙරසයේ ඉතිරි වැඩ සිදු කෙරෙමින් පවතී.

### 3.1.1.4 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - නිමා කිරීමේ හා විවිධ වැඩ

කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 202 ක කොන්ත්‍රාත් මිලකට M/s S D S Construction සමාගම වෙත ප්‍රදානය කරන ලදී. එහි ඉදිකිරීම් වැඩ 2023.11.02 දින ආරම්භ කර ඇති අතර සෝපානයේ වැඩ, පොළව මට්ටම් කිරීමේ වැඩ, සිවිලිම සවි කිරීම සහ ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කොටස් වෙන් කිරීමේ වැඩ (Partitioning) අවසන් කර ඇති අතර ප්‍රධාන කාර්යයන් වේ. 97% ක වැඩ අවසන් කරමින් ව්‍යාපෘති වැඩ අවසන් කිරීමට ආසන්නව ඇත. බිත්ති පින්තාරු කිරීමේ ඉතිරි වැඩ සිදු කෙරෙමින් පවතී.

### 3.1.1.5 අර්ධ ස්වයංක්‍රියකරණය කරන ලද නැගෙනහිර බහළු පර්යන්තය සඳහා පර්යන්ත මෙහෙයුම් පද්ධතිය (TOS)

- මෙම ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද අතර මාස 16 ක කාලසීමාවකින් පසුව 2024 අප්‍රේල් මාසයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- පර්යන්ත ගේට්ටු සඳහා අවශ්‍ය සියළුම දෘඩාංග හා යටිතල පහසුකම් වගකීම් කාලයෙන් මාස 6 ක් ගතවීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත භාර දී ඇත.

- මාර්ග, ගේට්ටු සහ නැගෙනහිර බහළු පර්යන්තයේ පරිපාලන ගොඩනැගිල්ල ඇතුළුව සිවිල් ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් සර්වර් ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට (configuration) බලපෑමක් එල්ල කර ඇත.

- අර්ධ ස්වයංක්‍රීය පර්යන්තයක් ලෙස, ස්ට්‍රැඩල් කැරියර්ස්, නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර, රේල් පීලි මත සවිකරන ලද ස්වයංක්‍රීය දොඹකර වැනි උපකරණ මෙහෙයුම් සඳහා සූදානම්ව තිබීම පර්යන්ත මෙහෙයුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයකි.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් 2025 ජූනි මස වන විට නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් ආරම්භ කිරීමට තීරණය කර ඇත.

- තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් ප්‍රතිශෝධිත කාලරාමුව තුළ කටයුතු කිරීමට උත්සාහ දරණ අතර නැගෙනහිර බහළු පර්යන්තයේ ක්‍රියාවලි ප්‍රතිශෝධනය කිරීමට අවශ්‍ය වේ.

## 3.1.2 බටහිර බහළු පර්යන්තය -I (WCT – I)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Ports Special Economic Zone Ltd., සමාගම සහ සිය දේශීය හවුල්කාරි සමාගම වන John Keells Holdings PLC සමාගම (APSEZ Consortium) ඇතුළත් හවුල් ව්‍යාපාරය විසින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් වශයෙන් ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ (BOT) පදනම යටතේ වසර 35 ක කාලයකින් බටහිර බහළු පර්යන්තය - I සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. බටහිර බහළු පර්යන්ත - I සංවර්ධනය කිරීම හා මෙහෙයුම් කිරීම සඳහා පර්යන්ත මෙහෙයුම්කරු ලෙස "කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (පුද්.) සමාගම" (CWIT) නමින් සමාගමක් ස්ථාපිත කර ඇත. ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම 2021 සැප්තැම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලද අතර, කොටස්හිමියන්ගේ ගිවිසුම, ඉඩම් කල්බදු ගිවිසුම හා ණය ප්‍රදානය කරන ආයතනය සමඟ එළඹෙන ලද ඍජු ගිවිසුම 2022පෙබරවාරි මාසයේදී ක්‍රියාත්මක කරන ලදී.

බටහිර බහළු පර්යන්ත - I මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු නෞකා තුනකට නැංගුරම්ලෑමේ පහසුකම් සැපයිය හැකි වන ලෙස මීටර් 20 ක් ගැඹුරු නැංගුරම්පොලකින් සහ මීටර් 1400 ක් දිග ජැටි බැම්මකින් සමන්විත පර්යන්තයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර ඇත. පර්යන්ත ප්‍රදේශය ආසන්න වශයෙන් හෙක්ටයාර 65 ක භූමි ප්‍රදේශයකින් සමන්විත වන අතර මෙහි වාර්ෂික බහළු මෙහෙයුම් ධාරිතාවය විස්සේ සම ඒක මිලියන 3.0 ක් වේ.

බටහිර බහළු පර්යන්ත - I හි ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. ජැටි බැම්ම, රැඳවුම් බැම්ම, භූමිය වැඩි දියුණු කිරීම හා සූදානම් කිරීමේ කටයුතු, ගොඩනැගිලි වැඩ හා බටහිර බහළු පර්යන්ත - I හි සහායක අංගණයේ වැඩ ක්‍රියාත්මකව පවතී. මේ වන විට 65% ක සමස්ත ඉදිකිරීම් ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| අදියර | සම්පූර්ණ කිරීමට ඇති වැඩ | අවසන් කිරීමට නියමිත කාලය |
|---|---|---|
| අදියර 1 | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම | - |
| අදියර 2 | උපකරණ හා පහසුකම්, ප්‍රමාණවත් ප්‍රාග්ධනය, ආරක්ෂාකාරී නාවික ගමනාගමනය සහ හැරීම් කටයුතු සමඟ මීටර් 600 ක් දිග ජැටි බැම්ම සහ පර්යන්ත ප්‍රදේශයට පිටුපස ප්‍රදේශය | ක්‍රියාත්මක දිනය වන 2025.02.26 දින සිට මාස 36 ක කාලයක් |
| අදියර 3 | ජැටි බැම්මේ මුළු දිග ප්‍රමාණය (මීටර් 1400) සහ ප්‍රධාන හැරීම් අවසන් කිරීම | ක්‍රියාත්මක දිනය වන 2026.02.26 දින සිට මාස 48 ක කාලයක් |
| අදියර 4 | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම | ක්‍රියාත්මක දිනය වන 2027.02.26 දින සිට මාස 60 ක කාලයක් |

### 3.1.3 බටහිර බහළු පර්යන්තය - II සඳහා දියකඩනය දීර්ඝ කිරීම

2019 ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුගතව, බටහිර බහළු පර්යන්තය - II ස්ථාපිත කිරීම සඳහා කොළඹ දකුණු වරායේ බටහිර දියකඩනය දීර්ඝ කිරීම ඊළඟ යෝජිත සංවර්ධන සැලැස්ම වන අතර එමඟින් බටහිර බහළු පර්යන්තය - I හි ජැටි බැම්ම දීර්ඝ කෙරෙනු ඇත.

දැනට පවත්නා බටහිර දියකඩනය ගැඹුරු මුහුද දෙසට තවදුරටත් දීර්ඝ කිරීම බටහිර බහළු පර්යන්ත - II ව්‍යාපෘතියට ඇතුළත් වන අතර එහිදී බටහිර බහළු පර්යන්ත - II භූමිය පිටුපස ප්‍රදේශයෙන් බටහිර දෙසට හෙක්ටයාර 50 – 70 ක අවම ඉඩ ප්‍රදේශයක් එකතුවන අතර බටහිර බහළු පර්යන්ත - I ට යාබදව බහළු විස්සේ සම ඒකක මිලියන 3.5 ක ධාරිතාවයෙන් යුක්ත වන ගැඹුර මීටර් 20 ක් සහ මීටර් 1200 - මීටර් 1400 ක් අතර දිගින් යුත් ජැටි බැම්මක් සමඟ දකුණු වරාය ද්‍රෝණිය නිර්මාණය වේ. මෙම ව්‍යාපෘතිය නිම වීමෙන් පසුව, බටහිර බහළු පර්යන්ත - I ලෙස ගැඹුර මීටර් 18 – 20 අතර වන මීටර් 2600 – 2800 ක දිගින් යුත් ඍජු ජැටි බැම්මක් සහ සේවා සැපයුම් සඳහා බටහිර බහළු පර්යන්ත - II පර්යන්තය පිටුපස හෙක්ටයාර 50 – 70 ක භූමි ප්‍රදේශයක් කොළඹ වරායට අයත් වනු ඇත.

දියකඩනයේ මෙම දීර්ඝ කිරීම් කාල පරිච්ඡේදය නිම වීමට, ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර 05 ක් දක්වා කාලයක් ගතවනු ඇත. දියකඩනය දීර්ඝ කිරීම අර්ධ වශයෙන් නිමවීමත් සමඟ බටහිර බහළු පර්යන්ත - II පර්යන්තය දීර්ඝ කිරීමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හැකි වනු ඇත. එබැවින්, 2028 වර්ෂයෙන් පසුව ව්‍යාපාර අහිමි වීමකට හේතුවිය හැකි ධාරිතාවය අඩු වීම මඟහරවා ගැනීම සඳහා බටහිර බහළු පර්යන්ත - II හි මෙහෙයුම් 2030 වර්ෂයට පෙර ආරම්භ කිරීමට ඉලක්ක කරමින්, එහි ඉදිකිරීම් 2025 වර්ෂයේදී ආරම්භ කිරීමේ අවශ්‍යතාවය මතුවී ඇත.

මෙම අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, රේඛීය අමාත්‍යාංශය හා එක්ව බටහිර බහළු පර්යන්ත - II හි දියකඩනය දීර්ඝ කිරීමේ සවිස්තරාත්මක සැලැස්ම සඳහා උපදේශකවරයෙකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇත. අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත් වහාම උපදේශක කාර්යය ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානයට පැමිණි උපදේශක වෙත ප්‍රදානය කරනු ලබන අතර අධ්‍යයනය ආරම්භ කරනු ඇත.

### 3.1.4 ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ගාල්ල වරාය කලාපීය වාණිජ වරායක් ලෙස එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සමගාමීව සංචාරක කර්මාන්ත ආශ්‍රිත වරායක් ලෙස සංවර්ධනය කිරීමට ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගනු ලැබ ඇත. ගාල්ල වරායේ සුවිශේෂී භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගෙන ගාලු බොක්ක හා සම්බන්ධ විනෝදාස්වාදය හා දේපළ සංවර්ධන අවස්ථා සඳහා පෞද්ගලික ක්ෂේත්‍රයෙන් ආයෝජන ආකර්ෂණය කර ගනිමින්, සාම්ප්‍රදායික වරාය සේවා වලට පමණක් සීමා නොවී තිරසර සංවර්ධන මොඩලයක් ලෙස නිර්මාණය කිරීම යෝජිත ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියට අයත් වේ.

මෙම ව්‍යාපෘතියට ගැඹුරු මඟී පර්යන්තයක් සහ එයට සම්බන්ධිත රැඳවුම් බැම්මක් ඉදිකිරීම, දියකඩන ඉදිකිරීම, ප්‍රවේශ ඇළ මාර්ගය හා ද්‍රෝණිය හෑරීම සහ අනෙකුත් පහසුකම් ඉදිකිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය නිමවීමෙන් අනතුරුව එහි ප්‍රතිලාභ ගාල්ල ප්‍රදේශයට මෙන්ම සමස්ත රටෙහිම ආර්ථික සංවර්ධනයට ලැබෙනු ඇත.
2024 මාර්තු මස හිමි වූ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, අභිලාෂීය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම 2025 ජනවාරි මාසයේ අවසන් වීමට නියමිතව ඇත.

ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අයෝජකයෙකු 2025 වසරේ තෝරාගනු ඇත.

### 3.1.5 ත්‍රිකුණාමලය වරායේ වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම

අධිවේගී ගුවන් මාර්ග ජාලය පුළුල් කිරීමත් සමඟ කොළඹ වරාය හා ක්ෂණිකවම සම්බන්ධවිය හැකි ගොඩබිම් සබඳතාවයක්, කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා විශාල සමුද්‍රාසන්න ගොඩබිමක්, ගැඹුරු වරාය පහසුකම් සහ පිහිටීමේ වාසිදායක තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම සුවිශේෂී ආර්ථික කලාපය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කළ හැක.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ත්‍රිකුණාමලය වරාය සඳහා එහි පවතින ඉඩම් ද ඇතුළුව කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කර ඇත.

කර්මාන්ත සංවර්ධනය සඳහා දුම්රිය මාර්ග සහ මහා මාර්ග සබඳතාවය සහිත ඉඩම් වෙන් කිරීමේ කටයුතු ජාතික වරාය ප්‍රධාන සැලැස්මේ ත්‍රිකුණාමලය කලාපීය සැලැස්මට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ප්‍රධාන සැලැස්මට අනුව දැනටමත් හඳුනාගෙන ඇත.

ත්‍රිකුණාමලය වරායේ කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විටත් ඉල්ලා ඇත. තවද, මධ්‍යම පරිසර අධිකාරියේ නිරීක්ෂණ අනුව, අවශ්‍ය කරනු ලබන පාරිසරික මාර්ගෝපදේශය ලබා ගැනීමට ක්‍රමෝපායික පාරිසරික තක්සේරු අධ්‍යයනයක් (SEA) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් ආරම්භ කර ඇත.

එ් අනුව, අනාගතයේදී ඵලදායී විය හැකි බවට අපේක්ෂා කරන කර්මාන්ත, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හෝ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් මගින් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සූදානමින් සිටී.

## 3.1.6 දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය (SAC&LH)

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය, චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් (CM Ports) සමාගම විසින් මෙහෙයවනු ලබන ආයෝජකයන්ගේ සුසංධානයක් මගින් ඉදිකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ, වර්ග මීටර් 150,000 ක් ආවරණය වන මහල් පහකින් යුත් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිවන අතර, එය දකුණු ආසියාවේ විශාලතම වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය වනු ඇත.

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වසර 50 ක් සඳහා ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ ව්‍යාපෘතියක් වශයෙන්, චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් (CM Ports), ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ඇක්සස් ඉංජිනියරින් පීඑල්සී සමාගම යන ආයෝජන ආයතන ත්‍රිත්වයේ නියෝජිතයන් විසින් කොළඹ දී විධිමත්ව අත්සන් තබන ලදී.

ඉඩම් කල්බදු ගිවිසුම 2023 ජූලි මාසයේදී අත්සන් තබන ලදී. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය මාස 42 ක් වේ.

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථාන ව්‍යාපෘතිය සඳහා වන නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රාරම්භක සැලසුම් නිෂ්කාශනය හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලැබී ඇති අතර, භූ විද්‍යාත්මක පර්යේෂණ කටයුතු 2024 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.

## 3.1.7 තලෙලෙමන්නාරම වරාය සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින ද්විපාර්ශ්වීය සබඳතාවයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මගී ප්‍රවාහන සේවයක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය අවශ්‍ය පියවර ගෙන ඇත.

යෝජිත සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශක්‍යතා අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද, මෙම වරාය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව මොඩලයක් යටතේ සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇති අතර, මෙය සැලකිල්ලට ගනිමින් ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අභිලාෂීය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමට පියවර ගෙන ඇත. අභිලාෂීය ප්‍රකාශ කිරීමේ කටයුතු ක්‍රියාත්මකව පවතින අතර, තෝරාගනු ලබන ලංසුකරුවන් 2025 වර්ෂයේ යෝජනා සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කැඳවනු ඇත.

## 3.1.8 ජය බහළු පර්යන්ත V ව්‍යාපෘතියේ ගැඹුරු නැංගුරම්පොල ධාරිතාවය පුළුල් කිරීම - සිවිල් වැඩ

ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර සවි කිරීමෙන් අනතුරුව මෙහෙයුම් සඳහා යොදවා ඇත. කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 5,035 කි.

### 3.1.9 ත්‍රිකුණාමලය වරායේ ඉංජිනේරු වැඩහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

ටෙන්ඩරය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව වෙත ප්‍රදානය කර ඇත. මෙහි ඉදිකිරීම් වැඩ 2023 අප්‍රේල් 03 දින ආරම්භ කර ඇති අතර 2024.08.15 දින අවසන් කරන ලදී. ව්‍යාපෘතිය ප්‍රමාණාත්මක ලෙස අවසන් කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ත්‍රිකුණාමල වරාය වෙත භාර දෙන ලදී. කොන්ත්‍රාත් මිල රුපියල් 252,851,266.93 කි.

### 3.1.10 ත්‍රිකුණාමලය වරායේ ජල සැපයුම් පද්ධතිය හා පොම්පාගාරය ඉදිකිරීම - පොම්පාගාරය ස්ථාපිත කිරීම

කොන්ත්‍රාත්තුව M/s Puritas (Pvt) Ltd., සමාගම වෙත ප්‍රදානය කරන ලද අතර කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලදී. කොන්ත්‍රාත්කරු 2023.12.02 දින වැඩබිම වෙත සේවකයින් හා උපකරණ යොදවන ලද අතර ව්‍යාපෘතිය 2024.08.17 දින ප්‍රමාණාත්මක ලෙස අවසන් කරන ලදී. මෙහි කොන්ත්‍රාත් මිල රු. 44,040,795.80 කි.

### 3.1.11 කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම

මෙම ව්‍යාපෘති වෙනුවෙන් අරමුදල් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රජය 2018 ජනවාරි 10 වෙනි දින ඉන්දියාවේ එක්ස්පෝට්-ඉම්පෝට් බැංකුව සමඟ ඩොලර් ණය ගිවිසුමකට එළැඹී ඇති අතර මෙම කාර්යය සිදු කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 45.27 ක මූල්‍ය සහායක් ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය උපදේශක කොන්ත්‍රාත්තුව හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වශයෙන් කොන්ත්‍රාත්තු දෙකකින් සමන්විත වේ.

මෙම ව්‍යාපෘති වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් හා උපදේශක සේවාව ලබා ගැනීම සඳහා 2020 ජූනි 30 දින Haskoning DHV Consulting PVT LTD., සමාගම සමඟ ව්‍යාපෘති කළමනාකරණ උපදේශක සේවා ගිවිසුමකට ඇතුළත් වී ඇති අතර මෙහි වැඩ 2020 ඔක්තෝම්බර් 12 දින ආරම්භ කර ඇත.

2024 දෙසැම්බර් මස අග භාගය වන විට, මූලික සැලසුම් වැඩ, පූර්ව සුදුසුකම් ලේඛනය සකස් කිරීම සහ සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සැකසීමේ කටයුතු අවසන් කරමින් උපදේශක කොන්ත්‍රාත්තුව 47% ක ප්‍රගතියක් ලබා ගෙන ඇත. කෙසේ වුවද, මෙම ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යෑම සහ පූර්ව සුදුසුකම් ලේඛනය සඳහා ඉන්දියාවේ එක්සිම් බැංකුවේ අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මේ වන විට තවත්වා ඇත.

මීට පිළියමක් ලෙස, මෙම ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා ඉන්දියානු රජය එක්සත් ජනපද ඩොලර් මිලියන 63.65 ක් ප්‍රදානයක් ලබා දීමට යෝජනා කර ඇත. මෙම ප්‍රදානය ලබා ගැනීම සඳහා ඉන්දියානු රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සහ ඊට අමතරව දැනට පවතින ඩොලර් ණය ගිවිසුම අවලංගු කරන ලෙස ඉන්දියානු රජයෙන් ඉල්ලීමක් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024.04.29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

මේ වන විට මෙම ප්‍රදානය ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුම අවසන් කිරීමේ ක්‍රියාවලියේ පවතී. මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් මෙම ප්‍රදානය පිළිබඳ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකිවනු ඇත.

### 3.1.12 ඉන්දියාව හා කන්කසන්තුරය අතර මගී ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීම.

මෙම පහසුකම 2023.06.16 දින විවෘත කර ඇති අතර බිම් සේවා බාහිරින් ලබා ගෙන අළුතින් ඉදිකරන ලද පර්යන්ත ගොඩනැගිල්ල මෙහෙයුම් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට්ඨාශය විසින් තීරණය කර ඇත. ඒ අනුව, අළුතින් ඉදිකරන ලද පර්යන්ත ගොඩනැගිල්ල භාවිතා කරමින් වර්තමානයේදී මගී ප්‍රවාහන සේවා (ආසන්න වශයෙන් සතියකට මගී නෞකා 4 ක්) සිදු කෙරෙමින් පවතී.

### 3.1.13 වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරමින් පවතින ව්‍යාපෘති

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාාරිය විසින් පහත සඳහන් ව්‍යාපෘති සිදු කරනු ලැබේ.

- මාර්ග සංවර්ධන අධිකාරිය හා වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු සමඟ සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැපයීම.
- නව වැඩහල් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩහල් ප්‍රතිස්ථානගත කිරීමට අවශ්‍යව ඇති අතර ඒ සඳහා ගොඩනැගිලි හතරකින් සමන්විත වැඩහල් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 2,089 (මිල ඉහළ යාමත් සමඟ) වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘති වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වන BEL-DGES JV සමාගම වෙත 2021 සැප්තැම්බර් 09 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර 2023 වසර අග භාගය වන විට ඉදිකිරීම් අවසන් කර ඇත. අවසන් බිල්පත ගෙවීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

#### 3.1.13.1 සමුද්‍රීය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)

වරාය පිවිසුම් අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට පහසුකම් සැලසීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රතිස්ථානගත කිරීම සඳහා කැනල් අංගණ පරිශ්‍රයේ මහල් 17 කින් යුතු ගොඩනැගිල්ලක් ඉදි කෙරෙමින් පවතී. මෙහි ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 4,999 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරිය

විසින් මෙම ව්‍යාපෘති කටයුතු සිදු කරනු ලැබේ. ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සේවාදායාගේ අවශ්‍යතා නිම කිරීම් වැඩ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද අතර 48% ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ව්‍යාපෘතිය 2025 මැයි අවසන් කිරීමට නියමිතය.

#### 3.1.13.2 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම

සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය පිළිබඳ කටයුතු අවසන් කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ හා ගෘහ අලංකරණ ශිල්පියෙකුගේ සේවය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, ගෘහ අලංකරණ ශිල්පියෙකු විසින් 3D ආකෘතිය හා පිරිවිතරයන් සකස් කරමින් පවතී. සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වැඩ 2025 මැයි මස වන විට අවසන් කිරීමට නියමිතව ඇති අතර ඉන් අනතුරුව ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ වැඩ ආරම්භ කරනු ඇත.

### 3.1.14 වරාය සන්නිවේදන පද්ධතිය

- සුදුසුකම් ප්‍රකාශ කිරීම් (EOQ) කැඳවා ඇගයීම් කර, කෙටි ලැයිස්තුගත කරන ලදී.
- යෝජනා සඳහා ඉල්ලීම් ලේඛනය පෞද්ගලික මූල්‍ය මොඩලයක් යටතේ සකස් කරන ලදී.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර අරමුදල් යෙදවීමට තීරණය කරන ලද අතර කෙටිලැයිස්තුගත කරන ලද ලංසුකරුවන් වෙත යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීමට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වේ.
- යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීමේ කටයුතු සිදු කර ගෙනයාම සඳහා වරාය අධිකාරියේ අභ්‍යන්තර අරමුදල් මොඩලය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.

## 3.2 අනාගත ව්‍යාපෘති හා වැඩසටහන්

### 3.2.1 කොළඹ වරායේ ජය බහළු පර්යන්ත V අංගණ ප්‍රදේශයේ ගල් අතුරා තාර දැමීමේ වැඩ

ආසන්න වශයෙන් වර්ග මීටර් 31,000 ක අංගණ ප්‍රදේශයක් ගල් අතුරා තාර දැමීම. මෙහි ප්‍රසම්පාදන කාර්යය සිදු කෙරෙමින් පවතී. මෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු. 895, 787,500.00 කි. ව්‍යාපෘති කාලසීමාව දින 365 ක් වන අතර 2025.03.01 දින ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතය. 2025 වසර තුළ දී ව්‍යාපෘති වැඩ 75% ක් පමණ අවසන් කිරීමට නියමිතය ඇත. 2025 වසර සඳහා වෙන් කර ඇති අයවැය රුපියල් මිලියන 750 කි.

### 3.2.2 නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් ගොඩනැගිල්ල සඳහා පිවිසුම් මාර්ගය ඉදිකිරීම.

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 261 කි. ව්‍යාපෘති කාලසීමාව දින 270 ක් වන අතර 2025.03.01 දින ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2025.12.31 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත අතර 2025 වසර සඳහා වෙන් කර ඇති අයවැය රුපියල් මිලියන 195 කි.

### 3.2.3 සේරම් ගේට්ටුව ප්‍රදේශයේ සේරම් වංගුවේ සිට ප්‍රධාන මාර්ගය අතර මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම.

මෙහි සැලසුම් සකස් කරමින් පවතින අතර 2025.05.01 දින ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2025.12.31 දිනෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය. 2025 වසර සඳහා වෙන් කරන ලද අයවැය මිලියන 195 කි.

### 3.2.4 ත්‍රිකුණාමලය වරායේ වරාය පිවිසුම් මාර්ගය සහ ගේට්ටු ව්‍යූහය ඉදිකිරීම.

2025.07.01 දින ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර 2025 වසරේදී 55% ක ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීමට නියමිතය. 2025 වසර සඳහා වෙන් කරන ලද අයවැය මිලියන 550 කි.

### 3.2.5 නැගෙනහිර බහළු පර්යන්තය - වැඩබිම් ගොඩනැගිල්ල සහ පහසුකම් සැපයීමේ ගොඩනැගිල්ල

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුදල් භාවිතා කරමින් නැගෙනහිර බහළු පර්යන්තයේ වැඩහල් ගොඩනැගිලි සහ සේවකයින් සඳහා සේවා ස්ථාන පහසුකම් සැපයීමට සැලසුම් කරන ලදී. වැඩහල් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලිනය 900 ක් වන අතර සේවකයින් සඳහා පහසුකම් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 750 කි. මේ වන විට සැකසුම අවසන් කිරීමේ ක්‍රියාවලියේ පවතින අතර ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

### 3.2.6 වරාය සම්මාන උළෙල - 2025

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අළෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන කොට්ඨාශය විසින් කොළඹ වරායේ අනෙකුත් පර්යන්තයන් හා සහයෝගීතාවයෙන් 2025 වසරේ වරාය සම්මාන උළෙල සංවිධානය කිරීමට සැලසුම් කරමින් පවතී. මෙය ජාත්‍යන්තර උළෙලක් වනු ඇති අතර ප්‍රධාන නැව් සමාගම් ප්‍රධානීන් මෙම උළෙලට සහභාගී වනු ඇත.

### 3.2.7 ව්‍යාපාරික දෘශ්‍යතාවය වර්ධනය කිරීම හා පුද්ගල ජාලගත සම්බන්ධතා ගොඩනැගීමේ අවස්ථා වර්ධනය කිරීම සඳහා නැව් සමාගම් ප්‍රධානීන් හමුවීම හා ප්‍රදර්ශන සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවනු ලබන පර්යන්තවල සැලකිය යුතු ධාරිතා වර්ධනයක් ඇති කිරීම සඳහා ඇති විභව්‍යතාවය විදහා දක්වමින් ප්‍රධාන ගෝලීය සමුද්‍රීය ආයතන සමඟ සම්බන්ධවීම සඳහා අළෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන කොට්ඨාශය හා මෙහෙයුම් කොට්ඨාශය ඒකාබද්ධව ක්‍රමෝපායික සැලැස්මක් සංවර්ධනය සකස් කර ඇත. මෙම ක්‍රියාමාර්ගයන්හි මූලික අංගයක් වන්නේ සබඳතා ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන පෙළේ නැව් සමාගම්වල ප්‍රධානීන් හමුවීම, සහයෝගීව කටයුතු කිරීමට ඇති අවස්ථා සොයා බැලීම හා ගෝලීය නාවික හා සේව සැපයුම් පරිසර පද්ධතිය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රමෝපායික හවුල්කරුවෙකු වශයෙන් ස්ථානගත කිරීමය.

මෙම සංචාරයන්ට අමතරව, විවිධ ජාත්‍යන්තර ප්‍රදර්ශන හා වෙළෙඳ සංසද සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාකාරීව සහභාගී වනු ඇත. ගෝලීය වෙළෙඳාමේ වෙනස් වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා ක්‍රමෝපායික පිහිටීම, පහසුකම් හා නම්‍යශීලීබව ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ කොළඹ වරායේ පවතින අනන්‍ය වාසි විදහා දැක්වීම සඳහා මෙම උත්සාහයන් මගින් අවධානය යොමු කර ඇත. නැව් සමාගම් ප්‍රධානීන් සමඟ සෘජු සම්බන්ධතා ගොඩනගා ගැනීම සහ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන් මගින් ක්‍රමෝපායික සන්ධාන ප්‍රවර්ධනය කිරීම සහ තිරසර වර්ධනයක් ඇති කරමින් ස්ථාපිත නෞකා සේවා සහ අළුතින් බිහිවන නෞකා සේවා යන ද්විත්වයම ආකර්ෂණය කර ගැනීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුණ වේ.

### 3.2.8 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ඩිජිටල් අළෙවිකරණ ව්‍යාපාර

ඩිජිටල් අළෙවිකරණ ව්‍යාපාර පිළිබඳ පර්යේෂණ සිදු කර ඇති අතර ඒ මත පදනම්ව 2025 වසරේදී පර්යන්ත සංවර්ධන කටයුතු නිමා කිරීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ඩිජිටල් අළෙවිකරණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානම්ව සිටිමු.

## 3.3 මෙහෙයුම් කාර්යසාධනය - 2024.12.31

### 3.3.1 කොළඹ වරාය

- **නෞකා පැමිණීම්**

| විස්තරය | 2023 | 2024 | % |
|---|---|---|---|
| **නැව්බඩු නෞකා** | | | |
| බහළුගත | 3,890 | 3,522 | -9.5 |
| සාම්ප්‍රදායික | 32 | 54 | 68.8 |
| වෙනත් නැව් බඩු | 180 | 230 | 27.8 |
| අළුත්වැඩියා සඳහා නෞකා | 45 | 46 | 2.2 |
| නැව් තෙල් සඳහා නෞකා | 44 | 74 | 68.2 |
| වෙනත් නෞකා | 46 | 42 | -8.7 |
| **පැමිණි මුළු නෞකා සංඛ්‍යාව** | **4,237** | **3,968** | **-6.3** |

- **බහළුගත නෞකා පැමිණීම**

| විස්තරය | 2023 | 2024 | % |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) | **1,521** | **1,337** | -12.1 |
| එස් ඒ ජී ටී සමාගම(SAGT) | **1,000** | **937** | -6.3 |
| සී අයි සී ටී සමාගම(CICT) | **1,369** | **1,248** | -8.8 |
| **මුළු බහළුගත නෞකා සංඛ්‍යාව** | **3,890** | **3,522** | **-9.5** |

- **බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)**

| **විස්තරය** | **2023** | **2024** | **%** |
|---|---|---|---|
| **ආනයන** | **495,101** | **589,927** | **19.2** |
| භාණ්ඩ සහිත | 438,234 | 541,155 | 23.5 |
| භාණ්ඩ රහිත | 56,867 | 48,772 | -14.2 |
| **අපනයන** | **494,905** | **579,328** | **17.1** |
| භාණ්ඩ සහිත | 283,440 | 301,094 | 6.2 |
| භාණ්ඩ රහිත | 211,465 | 278,234 | 31.6 |
| ප්‍රතිනැව්ගත කිරීම(Transshipment) | 5,754,247 | 6,315,195 | 9.7 |
| තැන්මාරු මෙහෙයුම්(Re-stowing) | 205,659 | 307,619 | 49.6 |
| **සමස්ත විස්සේ සම ඒකක** | **6,949,912** | **7,792,069** | **12.1** |
| **ප්‍රතිනැව්ගත කිරීමේ ප්‍රතිශතය(%)** | **83** | **81** | |

- **බහළු මෙහෙයුම් ධාරිතාවය අනුව (විස්සේ සම ඒකක)**

| **විස්තරය** | **2023** | **2024** | **%** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) | **1,965,130** | **2,413,162** | **22.8** |
| එස් ඒ ජී ටී සමාගම(SAGT) | **1,763,864** | **2,025,840** | **14.9** |
| සී අයි සී ටී සමාගම(CICT) | **3,220,918** | **3,353,067** | **4.1** |

- **කොළඹ වරාය - නැව්බඩු මෙහෙයවීම (ටොන්)**

| **විස්තරය** | **2023** | **2024** | **%** |
|---|---|---|---|
| ගොඩබාන ලද නැව්බඩු (ටොන්) | 53,569,162 | 62,112,102 | 15.9 |
| නැව්බඩු පැටවීම (ටොන්) | 46,104,426 | 52,481,808 | 13.8 |
| මෙහෙයවන ලද සමස්ත නැව්බඩු | **99,673,588** | **114,593,910** | **15.0** |

- **මෙහෙයුම් කරන ලද සමස්ත ටොන් ප්‍රමාණය**

| **විස්තරය** | **2023** | **2024** | **%** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) | 27,986,968 | 36,487,633 | 30.4 |
| එස් ඒ ජී ටී සමාගම (SAGT) | 22,812,891 | 25,563,582 | 12.1 |
| සී අයි සී ටී සමාගම(CICT) | 42,603,207 | 45,172,714 | 6.0 |
| සී පී සී (CPC) | 4,009,417 | 4,019,619 | 0.3 |
| වෙනත් පාලම් | 2,261,105 | 3,350,362 | 48.2 |
| **එකතුව** | **99,673,588** | **114,593,910** | **15.0** |

*එස් ඒ ජී ටී සමාගම සහ සී අයි සී ටී සමාගම සඳහා තක්සේරු කළ ටොන් ප්‍රමාණය ඇතුළුව

- බහළු මෙහෙයුම් ධාරිතාවය - පර්යන්ත/ ජැටි (විස්සේ සම ඒකක)

| විස්තරය | 2023 | 2024 | % |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය (JCT සහ ECT)** | | | |
| දේශීය | 208,383 | 285,204 | 36.9 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,729,272 | 2,042,577 | 18.1 |
| තැන්මාරු මෙහෙයුම | 27,476 | 85,381 | 210.7 |
| **එකතුව** | **1,965,131** | **2,413,162** | **22.8** |
| **සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)** | | | |
| දේශීය | 193,092 | 229,291 | 18.7 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,528,824 | 1,757,097 | 14.9 |
| තැන්මාරු මෙහෙයුම | 41,947 | 39,452 | -5.9 |
| **එකතුව** | **1,763,863** | **2,025,840** | **14.9** |
| **කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT)** | | | |
| දේශීය | 588,531 | 654,760 | 11.3 |
| ප්‍රතිනැව්ගත කිරීම | 2,496,151 | 2,515,521 | 0.8 |
| තැන්මාරු මෙහෙයුම | 136,236 | 182,786 | 34.2 |
| **එකතුව** | **3,220,918** | **3,353,067** | **4.1** |
| **කොළඹ වරාය (Port of Colombo)** | | | |
| දේශීය | 990,006 | 1,169,255 | 18.1 |
| ප්‍රතිනැව්ගත කිරීම | 5,754,247 | 6,315,195 | 9.7 |
| තැන්මාරු මෙහෙයුම | 205,659 | 307,619 | 49.6 |
| **එකතුව** | **6,949,912** | **7,792,069** | **12.1** |

## 3.3.2 සියලු වරායයන්

කොළඹ වරාය, හම්බන්තොට වරාය, ත්‍රිකුණාමලය වරාය, ගාලු වරාය හා කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරු තුඩුව හා කරෙයිනගර් වරායන් යන සියලු වරායන්හි මෙහෙයුම් කාර්යසාධනය

| විස්තරය | එකතුව |
|---|---|
| **නෞකා ගණන** | **4,605** |
| **ගොඩබාන ලද නැව් බඩු (ටොන්)** | **66,500,161** |
| **පටවන ලද නැව් බඩු (ටොන්)** | **53,739,009** |
| **මෙහෙයවන ලද නැව්බඩු (ටොන්)** | **120,239,170** |

## 3.4 මූල්‍ය කාර්යසාධනය 2024.01.01 සිට 2024.11.30 දක්වා (රු. මි.)

| විස්තරය | එකතුව |
|---|---|
| **ආදායම** | |
| මෙහෙයුම් ආදායම | 68,528.24 |
| වෙනත් මෙහෙයුම් ආදායම සහ පොලී ආදායම | 19,919.74 |
| **මුළු ආදායම** | 88,447.98 |
| **වියදම** | |
| සේවක වැටුප් | 17,990.06 |
| අතිකාල | 7,362.03 |
| ඉන්ධන, විදුලිය සහ වෙනත් ලිහිසි ද්‍රව්‍ය | 5,619.90 |
| වත්කම් නඩත්තු කිරීම | 2,572.71 |
| වෙනත් වියදම් (බාහිර කුලී ගාස්තු, කොන්ත්‍රාත් වැඩ, ගමන් වියදම් ආදිය.,) | 11,616.77 |
| **උප එකතුව** | **45,161.47** |
| **විදේශ විනිමය (පාඩු)/ලාභ වලට සහ විදේශ ණය පොළියට පෙර ලාභ (පාඩු)** | **43,286.51** |
| විදේශ ණය පොලිය | 2,341.47 |
| **විදේශ විනිමය (පාඩු)/ලාභ වලට පෙර සහ විදේශ ණය පොළියට පසු ලාභ/ (පාඩු)** | **40,945.04** |
| විදේශ විනිමය (පාඩු)/ ලාභ) | (1,490.84) |
| **විදේශ විනිමය (පාඩු)/ලාභ වලට පසු සහ බදු වලට පෙර ලාභ/ (පාඩු)** | **39,454.20** |
| ආදායම් බදු | (8,290.05) |
| **විදේශ විනිමය (පාඩු)/ලාභ සහ බදු වලට පසු ලාභ/ (පාඩු)** | **31,164.15** |

# 4. සී/ස ලංකා නැව් සංස්ථාව

සී/ස ලංකා නැව් සංස්ථාව, ජාතික මුහුදු ප්‍රවාහකයා වශයෙන් නැව් සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් ජාතික ආර්ථික වර්ධනයට සහාය වෙමින් රටේ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද මහගු සේවයක් සිදු කරයි. තවද නැව් අත්පත් කර ගැනීම, නැව් කුලියට ගැනීම හා කුලියට දීම, නැව් කළමනාකරණය, තැරැව්කාර කටයුතු, භාණ්ඩ නැව්ගත කිරීම් සහ නැව් නියෝජිත ජාලය පවත්වාගෙන යාම, සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සිදු කරනු ලැබේ.

2025 අයවැය කාරක සහා අදියරෙහි ප්‍රගතිය පිළිබඳ මෙම වාර්තාව මූලික වශයෙන් 2024.04.01 සිට 2024.12.31 දක්වා වූ මූල්‍ය පරිච්ඡේදය සඳහා සකස් කර ඇත. මෙම කාලසීමාව ලබාගෙන ඇත්තේ 2024/25 මූල්‍ය වර්ෂයෙහි 01, 02 සහ 03 කාර්තු වශයෙනි.

## 4.1 ප්‍රධාන අරමුණු

### 4.1.1 වෙළෙඳ ක්ෂේත්‍රය හා පාරිභෝගිකයන් උදෙසා

- ජාතික ආර්ථික වර්ධනයට උර දෙමින් රටෙහි ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කිරීම.
- කෙටිම කාලයක් තුල අවම මිල ගණන් යටතේ උපරිම පාරිභෝගික විශ්වාසය රකිමින් පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

### 4.1.2 රට හා සමාජය උදෙසා

- අනාගත ජාතික සංවර්ධන ක්‍රියාවලියෙහිදී නාවික මධ්‍යස්ථානයක් වශයෙන් රටෙහි සංවර්ධනයට උර දීම.
- පාරිභෝගික අවශ්‍යතාවය හඳුනා ගනිමින් තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආනයන ක්‍රියාවලියේදී නැව් ගාස්තු මෙරටදී ගෙවීම තුලින් (FOB Basis) විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීමට දායක වීම.
- රටෙහි තාප බල ශක්ති උත්පාදන අංශයෙහි නාවික සැපයුම් හා ප්‍රවාහන සහකරුවෙකු වශයෙන් දිගටම ක්‍රියා කිරීම.
- රටෙහි බලශක්ති/ඛණිජ තෙල් සැපයුම් කාර්යයෙහි නාවික සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම.

### 4.1.3 හිමිකාරිත්වය උදෙසා

- ලාභය උපරිම කරමින් විදේශ විනිමය රටට ඉතිරි කර ගැනීම තුළින්, රාජ්‍ය භාණ්ඩාගාරයට ඉහළම දායකත්වයක් සැපයීම.

## 4.2 ප්‍රධාන කාර්යයන්

- නැව් හිමිකාරීත්වය, නැව් කළමනාකරණය, නැව් කුලියට ගැනීම හා තැරැව් කිරීම.
- මුහුදු මාර්ගයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය.
- භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු (logistics) හා රේගු නිෂ්කාශන සේවා (අපනයන හා ආනයන).
- නැව් නියෝජිත සේවා (Agency Services).
- නාවික තැරැව්කාර සේවා (Brokering).
- නැව් කුලියට ගැනීම හා කුලියට දීම.
- පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මගින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා නාවික පුහුණුව ලබාදීම.

## 4.3 2023 හා 2024 වර්ෂවල පවත්නා ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය

| | ක්‍රියාකාරකම | අනු ක්‍රියාකාරකම් | භෞතික කාර්ය සාධනය | | ආදායම (රු. මිලියන) | |
|---|---|---|---|---|---|---|
| | | | 2024 | 2023 | 2024 | 2023 |
| 1.1 | භාණ්ඩ ප්‍රවාහනය - **NVOCC** ක්‍රියාකාරිත්වය (යාත්‍රා මෙහෙයුම් නැති පොදු වාහකයා) | සම්පූර්ණ බහාලුම් භාණ්ඩ ප්‍රවාහනය (FCL) | *බහාලුම් 793 | බහාලුම් 798 | *368.75 | 473.19 |
| 1.2 | | බහාලුම් නොවන භාණ්ඩ ප්‍රවාහනය කිරීම (LCL) | *2,033.84 F/T | 10,202.88 F/T | | |
| 2 | භාණ්ඩ ප්‍රවාහන සේවය | නිෂ්කාශන සේවා | **කාර්යයන් 345 | කාර්යයන් 318 | 124.02 | 48.84 |
| 3 | නියෝජිත සේවා | පොහොර ප්‍රවාහන යාත්‍රා | යාත්‍රා 2 | යාත්‍රා 2 | - | - |
| | | ගල් අඟුරු ප්‍රවාහන නැව් නියෝජිත | ***යාත්‍රා 22 | යාත්‍රා 22 | 27.27 | 39.23 |
| 4 | ලක්විජය විදුලි බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය | ප්‍රවාහන කුළිය මත යොමු වට්ටම් | - | - | - | - |
| | | බත්තල් ගාස්තු මත යොමු වට්ටම් | මෙ. ටොන් මි. 1.27 | මෙ. ටොන් මි. 1.29 | 337.45 | 334.12 |
| 5 | නාවික යාත්‍රා 02 සේවයෙහි යෙදවීම | ලං.නැ.සංස්ථා නැව් ගාස්තු ආදායම (ගල් අඟුරු ප්‍රවාහනය) | - | - | - | - |
| | | ලං.නැ.සංස්ථා නැව් කුළී ආදායම | ***** කුළී දින 530 | ***** කුළී දින 533 | ***** 2,408.31 | ***** 2,021.14 |
| 6 | නාවික පුහුණුව | තෙවන පාර්ශවීය යාත්‍රාවල ශිෂ්‍යභට / නිලධාරීන් සංඛ්‍යාව | ****** ශිෂ්‍යභට 1 | ****** ශිෂ්‍යභට 2 | 0.11 | 1.13 |
| | ******මුළු ආදායම | | | | **3,265.91** | **2,917.66** |

**මූලාශ්‍රය: මූල්‍ය කාර්ය සාධනය - කෙටුම්පත් ගිණුම් / භෞතික කාර්ය සාධනය - දෙපාර්තමේන්තු වාර්තා**

සටහන:

1. ***පසුගිය කාලසීමාව තුළ පැවති දැඩි ආර්ථික අර්බුදකාරී කාල පරිච්ඡේදය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය තවමත් සම්පූර්ණයෙන් යථා තත්වයට පත් නොවීම හේතුවෙන් සලකා බලන කාල සීමාව තුළ කොළඹ වරාය තුළ හැසිරවූ බහාළුම් ප්‍රතිදානය අඩු වී ඇත. දැඩි මූල්‍ය ප්‍රතිපත්ති, ඉහළ පාලිත ආනයන ප්‍රතිපත්ති සහ රාජ්‍ය අංශයේ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් රාජ්‍ය අංශයේ (එනම් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (SLR), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB), ලංකා විදුලිබල මණ්ඩලය (CEB)) ආනයන පරිමාව තියුණු ලෙස අඩු වී ඇති අතර එය CSC කාර්ය සාධනයට ද වක්‍රව බලපා ඇත.

2. ****ලොජිස්ටික් දෙපාර්තමේන්තුව සුපුරුදු ව්‍යාපාරික අවස්ථාවන්ට අමතරව නව ව්‍යාපාරික අවස්ථාවන් සුරක්ෂිත කර ගෙන ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව භෞතික කාර්ය සාධනයේ 8% ක වර්ධනයක් හා මූල්‍ය කාර්ය සාධනයේ 154% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

3. *****මෙම වසර තුළදී ද අවශ්‍ය නියෝජිතායතන සේවා සහිත වැඩි යාත්‍රා සංඛ්‍යාවක කාර්ය සාධනයක් පෙන්වීමට **CSC** සමත් වී ඇත.

4. **** නැව් කුලී මත ආදායම ජාත්‍යන්තර නැව් කුලී වෙළඳපළ අනුපාත මත රඳා පවතී. **2025** ජනවාරි මස 03 වන දින **Clarkson** දර්ශකයට අනුව **Ultramax** නෞකා සඳහා 2024 වර්ෂය තුළ දිනක සාමාන්‍ය නැව් කුලී අගය ඇ.ඩො. **16,201/-** වන අතර 2023 වර්ෂය තුළ දිනක සාමාන්‍ය නැව් කුලී අගය ඇ.ඩො. **14,315/-** වේ.

5. ******තුන්වන පාර්ශ්ව යාත්‍රාවල පුහුණුව ලැබූ ශිෂ්‍ය භටයින්/ නිලධාරීන් සංඛ්‍යාව, පුහුණු අවස්ථා පැවතීම මත රඳා පවතී.

6. *******2024 වසරේ සලකා බලන කාල සීමාව තුළ, පෙර වසර හා සාපේක්ෂව මුළු ආදායම 12% කින් වැඩි වී ඇත.

## 4.4 2024.12.31 දිනට නැව්වල නියුතු ශිෂ්‍ය භටයින්

| **තනතුර** | **සිලෝන් ප්‍රින්සස්** | **සිලෝන් බ්‍රීස්** |
|---|---|---|
| නාවික ශිෂ්‍යභට | - | 18 |
| ඉංජිනේරු ශිෂ්‍යභට | 06 | 02 |
| විදුලි ශිෂ්‍යභට | 03 | 01 |
| සාමාන්‍ය ශිෂ්‍යභට | 12 | 03 |
| **මුළු ගණන** | **21** | **24** |

මූලාශ්‍රය - CSC තාක්ෂණික දෙපාර්තමේන්තුව

## 4.5 CSC සමස්ත මූල්‍ය ප්‍රගතිය


### 4.5.1 ලාභ / අලාභ ප්‍රකාශය

අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා

| | වර්ෂය 2024<br>රු. මි. | වර්ෂය 2023<br>රු. මි. |
|---|---|---|
| ආදායම | 3,265.91 | 2,917.65 |
| සෘජු මෙහෙයුම් වියදම් | (1,718.94) | (1,907.06) |
| දළ ලාභය | **1,546.97** | **1,010.59** |
| වෙනත් ආදායම් | 71.10 | 708.06 |
| පරිපාලන වියදම් | (174.50) | (179.33) |
| මෙහෙයුම් ලාභය | 1,443.57 | 1,539.32 |
| <u>මූල්‍ය වියදම්</u><br>ණය පොළී වියදම් (නෞකා සඳහා ගත් ණය)<br>විනිමය අලාභය (Exchange Loss)<br>විනිමය ලාභය (නෞකා සඳහා ගත් ණය)-<br>Exchange Gain – Vessel Loan (Nominal Entry) | <br>(1,236.63)<br>(40.56)<br>388.21 | <br>(1,355.89)<br>(119.61)<br>368.78 |
| බදුවලට පෙර ලාභය / (අලාභය) | **554.59** | **432.60** |

**<u>සමස්ත මූල්‍ය ප්‍රගතිය</u>**

**<u>(අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය)</u>**




**මූලාශ්‍රය - කෙටුම්පත් ගිණුම**

## 4.6 යෝජිත නව ව්‍යාපෘති

### 4.6.1 ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර ඒකාබද්ධ බහාළුම් නාවික පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම

ඒකාබද්ධ ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකාව හා බංග්ලාදේශය අතර අවබෝධතා ගිවිසුමක් (Memorandum of Understanding) දැනටමත් අත්සන් කර ඇත. ඒ අනුව චිත්තගොං වරාය හා කොළඹ වරාය අතර ඒකාබද්ධ බහාළුම් පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීමට බංග්ලාදේශ නැව් සංස්ථාව (Bangladesh Shipping Corporation) වෙතින් යෝජනාවක් ඉදිරිපත් වී ඇත.

බංග්ලාදේශ නැව් සංස්ථාව සහ සී/ස ලංකා නැව් සංස්ථාව යන දෙපාර්ශවයම සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (Standard Operating Procedure- SOP) සම්පාදනය කරමින් පවතින අතර පෝෂක සේවාව ආරම්භ කිරීමට ප්‍රථම දෙරටෙහි අදහස් හා ප්‍රමුඛ අවශ්‍යතා පිළිබඳව කරුණු දෙපාර්ශවයේම එකගතාවය මත එයට ඇතුලත් වනු ඇත.

මෙම සේවාව මගින් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට සහ ආනයනකරුවන්ට තම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට මෙන්ම යුරෝපයට හා මධ්‍යධරණී රටවලට යැවෙන ප්‍රතිනැව්ගත භාණ්ඩ ප්‍රවාහනය කිරීමටත් පහසුකම් සැලසනු ඇත. දෙරට අතර මෙම පෝෂක සේවාව ආරම්භ කිරීම සඳහා හැකි ඉක්මනින් SOP අවසන් කිරීමට සී/ස ලංකා නැව් සංස්ථාව අපේක්ෂා කරයි.

### 4.6.2 නොරොච්චෝලේ බලාගාරයට අවශ්‍ය ගල්අඟුරු, පුත්තලම් නැංගුරම් පොලේ සිට ජැටිය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා ස්වයං-චලිත බත්තල් 05ක් ඉදිකිරීම

වසර 13ක කාලයක සිට සී/ස ලංකා නැව් සංස්ථාව විසින්, වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාව වන මෙ. ටො. මිලියන 2.25ක් බත්තල් භාවිතයෙන් නොරොච්චෝලේ නැංගුරම් පොලේ සිට එහි ජැටිය දක්වා වූ කිලෝමීටර 4.2ක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු බත්තල් ක්‍රියාකරුවකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවමින් සිටියි. වාර්තාවලට අනුව පසුගිය වසර 13ක කාලය තුළ, ගල්අඟුරු මෙ. ටො. මිලියන 21.84 ක් බත්තල් භාවිතයෙන් ප්‍රවාහනය කර ඇති අතර ඒ කාර්යය වෙනුවෙන් ඇ. ඩො. මිලියන 46.98 ක අරමුදල් ප්‍රමාණයක් මෙරටින් ඉවතට ගලා ගොස් ඇත.

බොහෝ අවශ්‍ය විදේශ මුදල් රඳවා තබා ගැනීමටත් මෙහෙයුම්වල තිරසාරත්වය සඳහාත් සී/ස ලංකා නැව් සංස්ථාවට හිමිකාරිත්වය ඇති බත්තල් ඉදි කිරීම අපේක්ෂාවයි.

# 5. ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Limited), කොළඹ තෙල් බැංකුව ලෙසද හැඳින්වේ. එය කලාපයේ ප්‍රමුඛතම තෙල් ගබඩා කිරීමේ ගුදම් සහිත ආයතනය වන අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණ අනුබද්ධ සමාගමකි.

## 5.1 2024 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘතිය | මූල්‍ය දායකත්වය | අපේක්ෂිත පිරිවැය (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| මෙට්‍රික් ටොන් 12000ක ධාරිතාවකින් යුත් ඉන්ධන ටැංකි 02ක් ඉදිකිරීම | දිගුකාලීන බදු පදනම / ශ්‍රී ලංකා වරාය අධිකාරිය/ ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් | මිලියන 2400 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තෝරාගත් ආයතනයට පැවරුම් ලිපියක් ලබා දෙන ලදී. ගිවිසුම තවමත් අත්සන් කර නැත. |
| ඉන්ධන පැටවීම සඳහා එන්ජිම මගින් ධාවනය වන පොම්පය සැපයීම සහ ස්ථාපනය කිරීම | ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ අරමුදල් | මිලියන 40 | අවසන් |
| බොයිලේරු, උත්පාදක සහ එන්ජින් කාමර සඳහා තාප අනාවරක සැපයීම සහ ස්ථාපනය කිරීම | ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ අරමුදල් | මිලියන 12 | 75% අවසන්.<br>ඉතිරි කොටස 2025 ජූනි මස අවසන් වේ. |
| ආරක්ෂක සංවේදක පද්ධතිය සහ අනෙකුත් උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීම | ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ අරමුදල් | මිලියන 20 | පවතින මායිම් තාප්පයේ අනාරක්ෂිත කොටසට උඩින් ආරක්ෂිත දැල සැකසීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරා ඇත. 2025 දී අවශ්‍ය ආරක්ෂිත උපකරණ මිලදී ගැනීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. |

## 5.2 මෙහෙයුම් කාර්යසාධනය

**2024 සහ 2023 මෙහෙයුම් සංසන්දනය කිරීම**


| නිෂ්පාදනය | පැටවූම් ප්‍රමාණය | | මුදා හරින ලද ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | 2023 මෙ.ටො. | 2024 මෙ.ටො. | 2023 මෙ.ටො. | 2024 මෙ.ටො. |
| LSFO 380 Cst | 337,123.447 | 487,642.826 | 344,736.166 | 492,791.987 |
| MGO | 75,243.343 | 76,694.246 | 75,449.809 | 75,913.226 |
| **එකතුව** | **412,366.790** | **564,337.072** | **420,185.975** | **568,705.213** |

ඉහත වගුවට අනුව, 2023 සහ 2024 අතර සම්පූර්ණ පැටවීමේ සහ මුදාහැරීමේ ප්‍රමාණයන් සසඳන විට, 2024 දී සම්පූර්ණ පැටවීම මෙට්‍රික් ටොන් 151,970.282 කින් වැඩි වූ අතර එය 2023 ට සාපේක්ෂව 31.64% ක වැඩිවීමකි. එලෙසම, සම්පූර්ණ මුදාහැරීමේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 148,519.238 කින් වැඩි වූ අතර එය 26.11% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

## 5.3 මූල්‍ය කාර්යසාධනය

2023 වර්ෂයේ සහ 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය සංසන්දනය

| | 2023 (රු.) | 2024.01.01-2024.11.30 (රු.) |
|---|---|---|
| ආදායම | 612,328,282 | 662,489,515 |
| දළ ලාභය | 384,757,547 | 407,293,416 |
| ශුද්ධ ලාභය | 243,875,173 | 241,027,539 |




## 5.4 මෙහෙයුම් කටයුතුවල නව ප්‍රවර්ධනයන්

2024 වර්ෂයේ මුළු පැටවුම් ප්‍රමාණය හා මුදා හරින ලද ප්‍රමාණය

| **නිෂ්පාදනය** | **පැටවුම් ප්‍රමාණය** | | **මුදා හරින ලද ප්‍රමාණය** | |
|---|---|---|---|---|
| | මෙ.ටො. | % | මෙ.ටො. | % |
| LSFO 380Cst | 487,642.826 | 86.41% | 492,791.987 | 86.65% |
| MGO | 76,694.246 | 13.59% | 75,913.226 | 13.35% |
| **එකතුව** | **564,337.072** | | **568,705.213** | |

ඉහත වගුවේ පෙන්වා ඇති සම්පූර්ණ පැටවීමේ සහ මුදාහැරීමේ ප්‍රමාණයන් සහ ඒවායේ ප්‍රතිශතවලට අනුව, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Limited) හි 2024 දී මෙට්‍රික් ටොන් 564,337.072 ක සම්පූර්ණ පැටවුම් ප්‍රමාණයක් හසුරුවා ඇත. මෙය 86.41% අඩු සල්ෆර් ඉන්ධන තෙල් 380Cst (LSFO) සහ 13.59% සමුද්‍ර වායු තෙල් (MGO) වලින් සමන්විත විය. එම වසරේම මුළු මුදාහැරීමේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 568,705.213 ක් වූ අතර, එය 86.65% LSFO 380Cst සහ 13.35% MGO වලින් සමන්විත වේ.

## 5.5 අනාගත ව්‍යාපෘති

- මෙට්‍රික් ටොන් 12000ක ධාරිතාවකින් යුත් ඉන්ධන ටැංකි 02ක් ඉදිකිරීම

# 6. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ ස්ථාපිත කරන ලදී. සිවිල් ගුවන් සේවා මෙහෙයුම්වල නිරුපද්‍රිතතාව, සුරක්ෂිතබව, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සහතික කිරීම, කර්මාන්තයේ අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය පවත්වා ගැනීම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූලික අවධානය යොමු කර ඇති කරුණු වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ආරක්ෂක රෙගුලාසි, සහතික කිරීම, බලපත්‍ර ලබා දීම, ගුවන් යානා අධීක්ෂණය, ගුවන් සංතරණ සේවා සහ ආර්ථික අධීක්ෂණය ඇතුළු පුළුල් පරාසයක ක්ෂේත්‍ර ආවරණය කරයි.

## 6.1 කාර්යසාධනය 2024

### 6.1.1 මෙහෙයුම් කාර්යසාධනය - 2024 වර්ෂය

- ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන්ගෙන් 80% කට වඩා තත්ත්ව හා අභ්‍යන්තර විගණන අංශය විසින් සාර්ථකව නිම කර ඇත.

- ස්වාධීන ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත අවසාන අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඊට අමතරව, ගුවන් සේවා නිරුපද්‍රිතා අධීක්ෂණ අංශය ගුවන් සේවා ආරක්ෂණ ගැටලු විසඳීම සඳහා ප්‍රධාන පරීක්ෂණ පහක් අවසන් කර ඇත.

- 2024 දී, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ඇතිව, නීති සහ බලගැන්වීම් අංශය විසින්, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු දෙකක්, අභියාචනාධිකරණ නඩු තුනක් සහ මහාධිකරණ නඩු දෙකක් ඇතුළුව අධිකරණ කටයුතු 36 කට සහභාගී වන ලදී.

- ශ්‍රී ලංකාවේ ළමා පරපුර අතර ගුවන් සේවා දැනුම වර්ධනය කිරීම සඳහා, පාසල් සිසුන් 300 ක් සම්බන්ධ කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් සහ ගුවන් තොටුපළ වැඩමුළු දෙකක් පවත්වන ලදී. මෙම මුලපිරීම්වල සාර්ථකත්වය "ගුවන්සර" සඟරාව ප්‍රකාශයට පත් කිරීම සහ "ගුවන් සැරිසර" රූපවාහිනී වැඩසටහන විකාශනය කිරීම සමඟ සමීපව බැඳී ඇති අතර එමගින් එම ප්‍රයත්නයන්හි අභිප්‍රාය සැලකිය යුතු ලෙස වැඩි දියුණු විය.

- තම ප්‍රධාන අරමුණු සාර්ථකව සාක්ෂාත් කර ගනිමින්, ගුවන් වෛද්‍ය සේවා ඒකකය විසින් ආසියා-පැසිෆික් කලාපයේ අනෙකුත් රටවලට තම ක්‍රියාකාරකම් ව්‍යාප්ත කරමින් ගුවන් වෛද්‍ය විශේෂඥතාව සහ පුහුණුව ලබා දෙන ලදී.

- ICAO හි විශ්වීය නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන (Universal Safety Oversight Audit Programme) යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රගතිය - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USOAP CMA) වරින් වර සමාලෝචන සහ අංශ රැස්වීම් හරහා ක්‍රමානුකූලව නිරීක්ෂණය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ICAO වෙත ප්‍රොටෝකෝල ගැටලු (PQ) ප්‍රතිචාර 738 ක් ඉදිරිපත් කරන ලදී.

- ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම, සහතික කළ ජාත්‍යන්තර මෙහෙයුම් හරහා සංචාරක ව්‍යාපාරයට සහ වෙළඳාමට සහාය වීම සඳහා, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා ගගන යාත්‍රාංගන අංශය මගින් සහතික අලුත් කිරීමේ විගණන පවත්වන ලදී. මීට අමතරව, මඩකලපුව ගුවන්තොටුපළේ බලපත්‍ර අලුත්

කිරීම සම්පූර්ණ කරන ලද අතර, එය ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියට මාරු කිරීම සනිටුහන් කරන ලදී. මේ වන විට දේශීය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම (AASL) විසින් කළමනාකරණය කරනු ලැබේ.

- ගුවන් සන්තරණ සේවා අංශය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත් අතර, ඒ අතරට ගුවන් ගමන් සේවා සැපයුම්කරුවන්ගේ විධාව කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ප්‍රකාශය (SLCAP 2290) ප්‍රකාශයට පත් කිරීම ද ඇතුළත් විය. ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට AIP සංශෝධන 5 ක්, AIP අතිරේක 6 ක්, ගුවන් තොරතුරු චක්‍රලේඛ (AIC) 6 ක් සහ NOTAM 311 ක් අනුමත කිරීම ඇතුළත් විය. මෙම අංශය ගුවන් ගමන් අනුමත කිරීම් 1,290 ක් සහ ව්‍යාපාරික වේලාවෙන් පිටත මෙහෙයුම් ඇතුළුව කාලසටහන්ගත නොකළ තාක්ෂණික නැවතුම්/වාණිජ නොවන ගොඩබෑම් 719 ක් සඳහා පහසුකම් සපයන ලදී. තවද, විදේශ කටයුතු අමාත්‍යාංශයට එකඟතා/විරෝධතා නොමැති සටහන් 358 ක් ලබා දුන් අතර, එමඟින් රාජ්‍ය තාන්ත්‍රික ගොඩබෑම් 158 ක් සහ රාජ්‍ය තාන්ත්‍රිකව ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීම් 200 ක් සිදු වූ අතර, එය මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා ශක්තිමත් කැපවීමක් පිළිබිඹු කරයි.

- පුද්ගල බලපත්‍ර අංශය ගුවන් සේවා වෘත්තිකයන් 2,657 දෙනෙකු සාර්ථකව සහතික කළ අතර ගුවන් සේවා පුහුණු සංවිධාන සඳහා සහතික කිරීමේ නිරීක්ෂණ ක්‍රියාකාරකම් 15 ක් පැවැත්වීය. මීට අමතරව, ගුවන් සේවා කර්මාන්තයේ ඉහළ නිපුණතා සහ අනුකූලතා ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා එහි කැපවීම පෙන්නුම් කරමින්, ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර, ගුවන් යානා නඩත්තු සේවකයින් සහ ගුවන්යානා ඩිස්පැචර්වරු සඳහා දැනුම පරීක්ෂණ 3,174 ක් මෙම අංශය විසින් පරිපාලනය කරන ලදී.

- පියාසර නිරුපද්‍රිතා නියාමන ශාඛාව යටතේ ඇති ගුවන් යානා මෙහෙයුම් අංශය විසින්, 2024 දී වැදගත් සන්ධිස්ථාන කිහිපයක් අත්කර ගන්නා ලදී. මෙම සන්ධිස්ථාන අතරට යුරෝපීය සංගමයේ ගුවන් සේවා නිරුපද්‍රිතා ඒජන්සියේ (EASA) මෙහෙයුම් නීතිරීතිවලට අනුකූලව මෙහෙයුම් රෙගුලාසි සංවර්ධනය කිරීම ඇතුළත් වූ අතර, 2018 ICAO විගණනයෙන් එළිදරව් වූ කරුණු සඳහා විසඳුම් ඉදිරිපත් කරමින් වසර අවසන් වන විට 80% ක් සම්පූර්ණ කරන ලදී. එයාර් සෙයිලාඕ (Air Ceilao), බ්ලූ ස්කයි ඒවියේෂන් (Blue Sky Aviation) සහ ඕරා ඒවියේෂන් ( Aura Aviation) සඳහා සහතික ලබා දීමේ ක්‍රියාවලීන් ආරම්භ කරන ලද අතර, මෙහෙයුම්කරුවන් පස් දෙනෙකු සඳහා ගුවන් මෙහෙයුම් සහතික අලුත් කරන ලදී. ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා භූමි හැසිරවීමේ සේවා සපයන්නන්ගේ බලපත්‍රය සාර්ථකව අලුත් කරන ලදී.

- ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ FITS ගුවන් සේවයේ සිදු කළ පුළුල් විගණන මගින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්ට ( SARP) සහ දේශීය රෙගුලාසි වලට අනුකූල වීම සහතික කරන ලද අතර, ගුවන් ගමන්, කැබින් සහ භූමි මෙහෙයුම් ආවරණය වන පරිදි පරීක්ෂණ 67 ක් මගින් සහාය විය. ඉන්දුනීසියාවේ BBN ගුවන් සේවය, Iran Air Tour ගුවන් සේවය, ජෙට් ස්ටාර් සහ Arkia ඊශ්‍රායල ගුවන් සේවය යන සමාගම් සඳහා විදේශීය ගුවන් මෙහෙයුම් සහතික ප්‍රදානය කරන ලදී. විදේශීය ගුවන් සේවා මෙහෙයුම් සහතික (FAOC) 31 ක් අලුත් කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය මෙහෙයුම්කරුවන් 46 දෙනෙකු ශ්‍රී ලංකාවට මෙහෙයුම් සිදු කළහ.

- මෙමම වර්ෂයේ දී, 2018 ICAO විගණනයෙන් සහ 2023 මැයි මස IS M ක්‍රියාත්මක කිරීමේ විගණනයෙන් සොයාගැනීම් ආමන්ත්‍රණය කරමින්, CAASL හි ගුවන්යානා

ලියාපදිංචි කිරීමේ සහ ගුවන් යෝග්‍යතා අංශය විසින් යුරෝපීය සංගමයේ ගුවන් සේවා නිරුපද්‍රිතතා ඒජන්සියේ (EASA) මෙහෙයුම් රීතිවලට අනුකූලව රෙගුලාසි සකස් කරන ලදී. EU-SA APP II හි විශේෂඥ සහාය ඇතිව, පවතින රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා මාර්ග සිතියමක් නිර්මාණය කරන ලද අතර, යුරෝපා සංගමයේ සහාය ලත් වැඩමුළු දෙකක් සහ වෙළුම් තුනකින් යුත් අභ්‍යන්තර ක්‍රියා පටිපාටි අත්පොතක පළමු කෙටුම්පත සම්පූර්ණ කිරීම ඇතුළුව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගන්නා ලදී.


- 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගුවන් සේවා ක්ෂේත්‍රය සැලකිය යුතු වර්ධනයන් අත්දකින ලදී. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (MRIA) යන දෙකටම සේවය කරමින් ශ්‍රී ලංකාවට ක්‍රියාත්මක වූ කාලසටහන්ගත විදේශීය ගුවන්සේවා 28 ක් ඇත. දේශීය ගුවන් සේවා සපයන්නන් වන ශ්‍රී ලංකන් ගුවන්සේවය සහ ෆිට්ස් එයාර් ඔවුන්ගේ දේශීය මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. ජෙට්ස්ටාර් ඒෂියා( Jetstar Asia) සහ මාලදිවයින් ගුවන්සේවය (Maldivian Airlines) සේවා ආරම්භ කළ නමුත් පසුව ගුවන් යානාවන්හි වූ හිඟයක් හේතුවෙන් ඒවා අත්හිටුවන ලදී. කැතේ පැසිෆික් එයාර්වේස් (Cathay Pacific Airways) කොවිඩ් -19 වසංගතයෙන් අනතුරුව මෙහෙයුම් නැවත ආරම්භ කළ අතර, චොංකිං (Chongqing) ගුවන්සේවය කෙටි කලක් ක්‍රියාත්මක වූ නමුත් මෙහෙයුම් ගැටලු වලට මුහුණ පාන ලදී.

- තුර්කි ගුවන් සේවය විසින් ඉස්තාන්බුල් සිට භාණ්ඩ ප්‍රවාහන සේවා පවත්වාගෙන ගිය අතර, ඉහළ භාණ්ඩ ඉල්ලුම හේතුවෙන් ඉන්දුනීසියාවේ බීබීඑන් ගුවන් සේවය මගින් විශේෂ අනුමැතියක් යටතේ කොළඹ සහ මාලේ අතර භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් ආරම්භ කරන ලදී.

### 6.1.1.1 ගුවන් ප්‍රවාහන සංඛ්‍යාලේඛන 2024

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ජාත්‍යන්තර ගුවන් ගමන්වල කාලසටහන්ගත හා කාලසටහන්ගත නොවන මගී හා භාණ්ඩ මෙහෙයුම්වල මාසික දත්තයන් එකතු කර සම්පාදනය කරනු ලබයි.

- **වාර්ෂික මගී සංචලනයන්**




මෙම ප්‍රස්ථාරය මගින් 2014 සිට 2023 දක්වා වාර්ෂික මගී සංචලනයන් සහ අනුරූප වසරින් වසර (YOY) වර්ධන අනුපාත නිරූපණය කරනු ලබයි. 2014 සිට 2018 දක්වා, මගී සංචලනයන් ක්‍රමයෙන් මිලියන 7.8 සිට මිලියන 10.8 ක උපරිමයක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය ඉහළ දෙසට යන වර්ධන ප්‍රවණතාවක් නියෝජනය කරයි.කොවිඩ් -19 වසංගතය සහ ඒ ආශ්‍රිත සංචාරක සීමාවන් හේතුවෙන් මගී සංචලන මිලියන 2.4 දක්වා (වසරෙන් වසරට 76.0% ක අඩුවීමක්) පහත වැටීම හේතුවෙන් 2020 දී සීඝ්‍ර පහත වැටීමක් සිදු වූ අතර, 2022 දී මගී සංචලන මිලියන 5.5 කට ආසන්න වෙමින් සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වූ අතර එය වූ මෙම ප්‍රකෘතිමත් වීම 2023 දක්වා අඛණ්ඩව සිදු වූ අතර මගී සංචලන මිලියන 7.5 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 දී මගී සංචලන තවමත් 2018 දී අත්පත් කරගත් පූර්ව වසංගත උච්චතම අවස්ථාව වන මිලියන 10.8 ට වඩා පහළින් පවතී.


2024 ජනවාරි-සැප්තැම්බර් දත්ත වලට අනුව, වසංගතයට පෙර පැවති මට්ටම්වලින් මගී ගමනාගමනය 80% දක්වා ඉහළ ගොස් තිබේ. මෙම වසරේ සංචාරකයින්ගේ පැමිණීම් සහ මගී සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමත් සමඟ, වසර අවසන් වන විට ශ්‍රී ලංකාව පූර්ව කොවිඩ් ගමනාගමන පරිමාවෙන් 90% දක්වා ළඟා වනු ඇතැයි හෝ එය ඉක්මවා යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ගුවන් යානා සහ භාණ්ඩ ප්‍රවාහන චලනයන් පිළිබඳ පහත ප්‍රස්ථාර මගින් මගී සංචලනය හා සමාන ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරේ.


- **වාර්ෂික භාණ්ඩ ප්‍රවාහනය**




- **වාර්ෂික ගුවන්යානා සංචලනය**



- **මාසික මගී සංචලනයන්**




ප්‍රස්ථාරයේ දක්වා ඇති පරිදි, ප්‍රදේශ ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි, 2024 සංඛ්‍යා, මාසයෙන් මාසයට පූර්ව වසංගත මට්ටම් කරා ක්‍රමයෙන් ළඟා වෙමින් පවතී. ඒවා 2019 දත්ත සමඟ බොහෝ දුරට සමපාත වන අතර 2025 වන විට එම මට්ටම් ඉක්මවා යාම පුරෝකථනය කර ඇත.

### 6.1.1.2 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ප්‍රධාන කාර්ය සාධනය පදනම් වූ මෙහෙයුම් කාර්ය සාධනය

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංඛ්‍යාලේඛන වැඩසටහන යටතේ ආයතනයේ සෑම අංශයකින්ම මාසික කාර්ය සාධනය එකතු කරනු ලබන අතර පහත විශ්ලේෂණ මගින් 2024 වසරේ සංවිධානයේ කාර්ය සාධනය පෙන්නුම් කරයි.


**මූලික/යාවත්කාලීන කරන ලද රෙගුලාසි**

2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ගුවන් යානා මෙහෙයුම්, ගුවන් සන්තරණ සේවා, ගුවන්තොටුපල සහ ගුවන් වෛද්‍ය සේවා ඇතුළු ප්‍රධාන අවධානය යොමු වූ ක්ෂේත්‍ර හරහා CAASL විසින් සංවර්ධනය කරන ලද රෙගුලාසි, නිවේදන සහ රීති ගණන පහත ප්‍රස්ථාරයෙන් නිරූපණය කෙරේ.



**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතික**

2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ගුවන් ගමන් ආරක්ෂාව, නිරුපද්‍රිතතාව සහ ගුවන් සේවා සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතික සහ බලපත්‍ර ගණන ප්‍රස්ථාරයෙන් දැක්වේ.




**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිකුත් කරන ලද අනුමැතීන්**

| දර්ශකය | සංඛ්‍යාව |
|---|---|
| කොළඹ පියාසර තොරතුරු කලාපයට ඉහළින් පියාසර කරන ගුවන්යානා සංඛ්‍යාව | 29853 |
| ගුවන් වැඩ අනුමත කිරීම් සංඛ්‍යාව | 172 |
| ගොඩබෑමේ නිෂ්කාශන නිකුත් කිරීම | 472 |
| ඉහළින් පියාසර කිරීමේ නිෂ්කාශන නිකුත් කිරීම | 1007 |
| කාලසටහන්ගත නොවන ගුවන් ගමන් අනුමත කිරීම් ගණන | 1479 |
| අනුමැතිය ගුවන් මෙහෙයුම් සඳහා නිවේදන (NOTAM) නිකුත් කිරීම සඳහා | 263 |
| උස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය | 95 |
| කුළුණු අනුමත කිරීම් සංඛ්‍යාව | 114 |
| භාණ්ඩ ගබඩාවේ ආයුධ ප්‍රවාහනය | 54 |
| දේශීය ගුවන්ගමන් කාලසටහන් අනුමත කිරීම් | 41 |
| ජාත්‍යන්තර ගුවන්ගමන් කාලසටහන් අනුමත කිරීම් | 381 |
| අන්තරායකර භාණ්ඩ බලපත්‍ර තාවකාලික අනුමැතිය | 8 |
| උපදේශක අනුමැතීන් | 9 |
| විශේෂ මෙහෙයුම් (විශේෂ ගුවන් ගමන් අනුමත කිරීම්) | 3 |

### 6.1.1.3 මානව සම්පත් කාර්යසාධනය

අධිකාරියේ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුම සේවකයින් විසින් වර්ධනය කරන බව සහතික කිරීම සඳහා, මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම සහ එහි දැක්මට අනුකූල ඵලදායී ශ්‍රම බලකායක් ක්‍රියාත්මක කිරීම CAASL මගින් අඛණ්ඩව සිදු කරන ලදී. 2024 වර්ෂයේදී දේශීය, ජාත්‍යන්තර සහ මාර්ගගත වේදිකාව හරහා පවත්වන ලද පුහුණු/සම්මන්ත්‍රණ සහ වැඩමුළු ඇතුළු මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා දහතුන් මිලියන තිස් එක්දහස් අසූවයි ශත අනූ එකක් (රු.13,031,080.91) වැය කර ඇත.

සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ, මානව කුසලතා වර්ධනය කිරීම සහ උපයෝගී කර ගැනීම සඳහා විකල්ප පුහුණු ක්‍රම වෙත ළඟා වීම ඉලක්කය වූ බැවින්, මාර්ගගත පහසුකම් හරහා සේවකයින්ට පුළුල් පරාසයක පුහුණුවක් ලබා දෙන ලදී.

**2024 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 10 දක්වා**

| | පුහුණුවීම් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව | පුහුණු මිනිස් දින ගණන |
|---|---|---|---|
| අභ්‍යන්තර පුහුණු වැඩසටහන් | 5 | 89 | 157 |
| විදේශ රැස්වීම්/සම්මේලන/පරිසංවාද | 12 | 12 | 59 |
| විදේශ පුහුණුව/ සම්මන්ත්‍රණ/ වැඩමුළු | 20 | 21 | 102 |
| දේශීය පුහුණුවීම්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු | 19 | 72 | 334 |
| මාර්ගගත පුහුණුවීම්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු | 6 | 19 | 114 |
| මාර්ගගත රැස්වීම්/සම්මේලන/පරිසංවාද | 0 | 0 | 0 |
| **එකතුව** | **62** | **213** | **766** |

## 6.1.2 මූල්‍ය සහ ආදායම් කළමනාකරණ කාර්යසාධනය

| **ආදායම්** | **අයවැය ආදායම - 2024 රු. මි.** | **සැබෑ ආදායම 2024 - රු. මි.** | **මූල්‍ය ප්‍රගතිය %** |
|---|---|---|---|
| විදේශීය විකුණුම් අධිභාරය | 1,080 | 1,080 | 100% |
| අපගමන බද්දේ (Embarkation Levy) සේවා ගාස්තුව | 350 | 254 | 73% |
| නියාමන සේවා වලින් උපයන ආදායම | 138 | 143 | 104% |
| පොලී ආදායම | 600 | 608 | 101% |
| වෙනත් මෙහෙයුම් නොවන ආදායම් | 5 | 3 | 60% |
| **මුළු ආදායම** | **2,173** | **2,088** | **96%** |

| **වියදම** | **අයවැය වියදම් - 2024 රුපියල්. මිලියන** | **සැබෑ අයවැය වියදම් - 2024 රුපියල්. මිලියන** | **මූල්‍ය ප්‍රගතිය %** |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | 976 | 893 | 91% |
| **ප්‍රාග්ධන වියදම්** | 41 | 40 | 97% |
| **මුළු වියදම** | 1,017 | 933 | 92% |

- **විදේශීය විකුණුම් අධිභාරය (OSS)**

2024 වර්ෂය සඳහා විදේශ විකුණුම් අධිභාරයෙන් (OSS) CAASL ලද ආදායම ශ්‍රී.ල.රු. 1,080,000,000.00 ක් වූ අතර එය 2023 වර්ෂයේ ආදායම ශ්‍රී.ල.රු. 3,771,642,993.00 ට සාපේක්ෂව 71% ක සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරයි.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2024 අප්‍රේල් 22 දිනැති සිය ලිපිය (යොමුව TO/REV /01/14/14-11) මගින්, 2024/02/19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, මාසිකව රුපියල් මිලියන 90 ක් රඳවා ගැනීමෙන් අනතුරුව විදේශීය විකුණුම් අධිභාර ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලෙස CAASL වෙත උපදෙස් දෙන ලදී.

මෙම උපදෙස් වලට අනුකූලව, CAASL විසින් විදේශීය විකුණුම් අධිභාර (OSS) ආදායම පහත පරිදි භාණ්ඩාගාරයට නිසි ලෙස ප්‍රේෂණය කර ඇත.

| **කාල පරිච්ඡේදය** | **ගෙවීම් දිනය** | **මුදල් ගෙවීම (රු.)** |
|---|---|---|
| 2024 ජනවාරි 24 | 24-මැයි -16 | 377,549,950.14 |
| 2024 පෙබරවාරි 24 | 24-මැයි -16 | 319,250,486.41 |
| 2024 මාර්තු 24 | 24-මැයි -16 | 316,180,430.16 |
| 2024 අප්‍රේල් 24 | 24-මැයි -30 | 277,209,399.77 |
| 2024 මැයි 24 | 24-ජූලි-2 | 335,481,034.01 |
| 2024 ජූනි 24 | 24-ජූලි -22 | 211,108,303.03 |
| 2024 ජූලි 24 | 24-අගෝ-23 | 273,225,128.50 |
| 2024 අගෝස්තු 24 | 24-සැප්-26 | 387,626,807.85 |
| 2024 සැප්තැම්බර් 24 | 24-ඔක්-30 | 257,125,131.81 |
| 2024 ඔක්තෝබර් 24 | 24-නොවැ-27 | 214,526,946.31 |
| 2024 නොවැම්බර් 24 | 24-දෙසැ-27 | 219,696,971.22 |
| | **එකතුව** | **2,175,999,722.50** |

- **අපගමන බද්දෙන් (Embarkation Levy) සේවා ගාස්තුව**

2024 වර්ෂය සඳහා අපගමන බද්ද රැස් කිරීමේ ඇස්තමේන්තුගත සේවා ගාස්තුව රුපියල් 311,211,122.46 කි. සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් පහත පරිදි අපගමන බද්ද රැස් කර ගෙවා ඇත.

| **අපගමන බද්දෙන් වැය කළ වටිනාකම** | **මුදල (මිලියන)** |
|---|---|
| මහා භාණ්ඩාගාරය | 36,642 |
| ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම (AASL) | 7,894 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) | 3,947 |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) | 311 |
| **මාසය සඳහා වැය කළ අපගමන බද්දේ එකතුව** | **48,794** |

- **නියාමන සේවා ආදායම**

2023 වසරට සාපේක්ෂව 2024 දී නියාමන සේවා ආදායම 8% කින් වර්ධනය වී ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 142 ක් විය.

භාණ්ඩාගාරයට සිදු කරන ලද ඉහත ගෙවීම්වලට අමතරව, 2024 දී සිවිල් ගුවන්සේවා අධිකාරිය ඒකාබද්ධ අරමුදලට රුපියල් මිලියන 750 ක දායකත්වයක් ලබා දී ඇත.

### 6.1.3 කාලපරිච්ඡේදය තුළ මුහුණ දුන් අභියෝග

- කාර්ය මණ්ඩල හිඟය
- කර්මාන්තයට සහ කලාපයට සාපේක්ෂව පවතින වැටුප් පරිමාණය හේතුවෙන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම අභියෝගාත්මක කාර්යයක් බවට පත්ව ඇත. රජය විසින් පනවන ලද සීමාවන් හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම වරින් වර ප්‍රමාද වී ඇත.
- විදේශ මුදල් සීමාවන් සහ රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හේතුවෙන් අවශ්‍ය විදේශ පුහුණුව ලබා දීමේ දුෂ්කරතාව.
- ICAO රැස්වීම්/ වැඩ සැසි/ පුහුණුවීම් සඳහා නිරාවරණය නොවීම.
- නීති සම්පාදනය සහ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන්, 70% ක් පමණ වැඩ කටයුතු නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් රජයේ ආයතනවල සහාය ඇතිව සිදු කළ යුතු අතර, එම ආයතනවල ප්‍රමාදයන් පාලනය කිරීමට ඒකකයට හැකියාවක් නැත.
- වේගවත් තාක්ෂණික දියුණුව සමඟ ඉදිරියට යාම.
- සංවේදී ගුවන් සේවා දත්ත සඳහා සයිබර් ආරක්ෂණ අවදානම් ඉහළ යාම.
- පද්ධති හරහා අන්තර් ක්‍රියාකාරීත්වය සහ ප්‍රමිතිකරණය සහතික කිරීම.

### 6.1.4 2025 වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත අනාගත ව්‍යාපෘති

- ශ්‍රී ලංකා ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශයේ (AAIBSL) පනත් කෙටුම්පතේ අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙතින් ලැබීමට නියමිත අතර, අනතුරුව පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩලය වෙතින් නව අනුමැතියක් ලබා ගත යුතුය.
- ගුවන්යානා ජාතිකත්වය සහ ලියාපදිංචි ලකුණු සහ ගුවනින් අනතුරුදායක භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.
- කේප්ටවුන් සම්මුතියේ සහ බීජිං සම්මුතියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් නීති කෙටුම්පත් කරනු ලබමින් සිටී.
- නීති කෙටුම්පත් සම්පාදක විසින් 2014 මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නීති කෙටුම්පත් කරන ලද අතර එය ගරු නීතිපතිවරයාගේ නිෂ්කාශනය සඳහා ඉදිරිපත් කර ඇත. ඉන්පසු එය අපරානුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නව අනුමැතිය ලබා ගත යුතුය.
- 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත රජයේ ප්‍රතිපත්ති සහ කර්මාන්ත අවශ්‍යතා අනුව සංශෝධනය කෙරේ. සංශෝධන පනත් නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරනු ලබමින් සිටින අතර සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ නව අනුමැතියක් ලබා ගත යුතුය.
- අතින් ක්‍රියාත්මක කරන AIS (ගුවන් තොරතුරු සේවය) සිට ස්වයංක්‍රීය AIM (ගුවන් තොරතුරු කළමනාකරණය) දක්වා මාරුවීම.
- යටිතල පහසුකම් ව්‍යාපෘති.
    - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පර්යන්තය II ඉදිකිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දේශීය පර්යන්තයක් ඉදිකිරීම.
- ගුවන් සේවා කර්මාන්තයට අදාළ පර්යේෂණ පහත පරිදි සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
    - ශ්‍රී ලංකාවේ පොදු ගුවන් සේවා ක්ෂේත්‍රයේ අභියෝගවලට මුහුණ දීම සහ අනාගත අභිලාෂයන් හඳුනා ගැනීම.
    - ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයේ රැකියා අවස්ථා සහ ශ්‍රම බලකායේ ගතිකත්වය සිතියම්ගත කිරීම: පුළුල් රැකියා වෙළඳපොළ විශ්ලේෂණයක්.
- ජාතික තිරසර ගුවන් සේවා පාරිසරික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

- ගුවන් සේවා අංශයෙන් $CO_2$ විමෝචනය අවම කිරීම සඳහා වන රාජ්‍ය ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ කටයුතු නිම කරන ලදී.
- ජාතික පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) සහ එක්සත් ජාතීන්ගේ (UN) තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ සමපාත වේ.
- ICAO ප්‍රමිතීන්ට අනුකූලව මිනිසුන් රහිත ගුවන් යානා නිරීක්ෂණ පද්ධතියක් (UAMS) ක්‍රියාත්මක කිරීම.
- මිනිසුන් රහිත ගුවන් යානා නියමුවන් සඳහා බලපත්‍ර පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, එයට මිනිසුන් රහිත ගුවන් යානා නියමු බලපත්‍ර නිකුත් කිරීම ඇතුළත් වේ.
- CAASL කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම
- බලපත්‍ර පද්ධතිය නවීකරණය කිරීම
- අපගමන (LK) සහ විදේශ විකිණුම් අධිභාර (EJ) බදු රැස් කිරීම සඳහා ස්වයංක්‍රීය මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සම්පූර්ණ කිරීම
- ICAO ප්‍රමිතීන්ට අනුකූලව පියාසර කාර්ය මණ්ඩලය සහ පියාසර නොවන කාර්ය මණ්ඩලය යන දෙඅංශයටම නව පරිගණක පාදක විභාග පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ගුවන් සේවා පුහුණුවේ ඉහළම මට්ටමේ නිපුණතාවය සහ නිරුපද්‍රිතතාව පවත්වා ගැනීම සහ අනුකූලතාව සහතික කිරීම සඳහා ICAO ප්‍රමිතීන්ට අනුකූලව නව පුහුණු සංවිධාන සහතික කිරීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූලව CAASL හි ISO 9001:2015 සහතිකය ලබා ගැනීම සහ තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- ආරක්ෂක ප්‍රොටෝකෝල වැඩිදියුණු කිරීම සහ නියාමන අනුකූලතාව සහතික කිරීම සඳහා ICAO ප්‍රමිතීන්ට අනුකූලව කර්මාන්තය පුරා ආරක්ෂිත කළමනාකරණ පද්ධතියක් (SMS) ක්‍රියාත්මක කිරීම.
- අනාගත ගුවන් සේවා වෘත්තිකයන් සංවර්ධනය කිරීමේදී එහි වලංගුභාවය සහ ඵලදායීතාවය සහතික කරමින්, ICAO ප්‍රමිතීන්ට අනුකූලව ජාතික මට්ටමින් ඊළඟ පරම්පරාවේ ගුවන් සේවා වෘත්තිකයන් (NGAP) වැඩසටහන අඛණ්ඩව පැවැත්වීම.
- කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළ කාර්යසාධනය මත පදනම් වූ සන්නිවේදනය සහ ආවෙක්ෂණය (PBCS) ක්‍රියාත්මක කිරීම, පද්ධතිමය වශයෙන් පුළුල් තොරතුරු කළමනාකරණය (SWIM), සහයෝගී පරිසරයක් සඳහා පියාසර සහ ප්‍රවාහ තොරතුරු (FF-ICE) සහ ප්‍රධාන ගුවන් ගමනාගමන පාලන මධ්‍යස්ථාන (ATC) තුළ නියම කරන ලද ප්‍රවේශයක් භාවිතා කරමින් තෙහෙට්ටුව අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම.
- ගුවන්යානා තොරතුරු ප්‍රකාශනයේ නව සංස්කරණයක් (2025 දී 4වන සංස්කරණය) ප්‍රකාශයට පත් කිරීම සඳහා සූදානම් කිරීම.
- ගුවන් සන්තරණ සේවා සපයන්නාගේ බලපත්‍ර ලබා දීම (AISP, ATSP, ACOM, CNSP)

# 7. ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

සී / ස ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) යනු 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත මගින් ලබා දී ඇති විධි විධාන යටතේ ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු කිරීම සඳහා 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි. එය, ශ්‍රී ලංකාවේ ඇතැම් විශේෂිත සිවිල් ගුවන් සේවාවන් හී එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස සිය කාර්යභාර්ය අඛණ්ඩව ඉටු කරයි.

# 7.1 2024 වර්ෂයේ කාර්ය සාධනය

## 7.1.1 2024 දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (බ.ජා.ගු) සංවර්ධන ව්‍යාපෘතිය, දෙවන කොටස - අදියර II A පැකේජය - මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ආශ්‍රිත වැඩ**

දෙවන මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම තුලින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙ හි මගීන් හැසිරවීමේ ධාරිතාව වසරකට මිලියන 15 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරිනි. මගී පර්යන්ත ගොඩනැල්ල ඉදිකිරීමට සමගාමීව ගුවන් පාලම් සහිත නව පිවිසුම් මාර්ග පද්ධතියක්, බහු මහල් රථගාලක්, ජල ටැංකියක්, ජීව වායු සැලැස්මක් සහ කොම්පෝස්ට් පද්ධතියෙන් සමන්විත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක්, මලාප්‍රවහන පවිත්‍රාගාරය සහ විදුලිබල සැපයුම් පද්ධතිය ක් වැනි අනුපූරක පහසුකම් ද වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරිණි.

මූල්‍ය අර්බුදය හමුවේ සියලුම විදේශ ණය ආපසු ගෙවීම් නතර කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණයෙන් පසුව මෙම ව්‍යාපෘතියට අරමුදල් සැපයීමේ නියෝජිතායතනය (JICA) ණය මුදල් මුදාහැරීම නතර කළ බැවින් ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම 2022 දෙසැම්බර් අවසන් කරන ලදී.
ගිවිසුම අවසන් කිරීමත් සමග ඉදිකිරීම් වැඩබිමෙහි නඩත්තු කටයුතු සී/ස ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ආයෝජකයා) විසින් බාරගන්නා ලදී. ඉදිකිරීම් අතරමග නවතා දැමූ ප්‍රධාන මගී පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත අරඹන තුරු සිදුවිය හැකි හානිය අවම කිරීමට සිදුකල යුතු හඳුනාගත් ආරක්ෂිත වැඩ, රු.මි. 477 ක කොන්ත්‍රාත්තු පිරිවැයක් යටතේ ආරම්භ කරන ලද අතර 2024 පෙබරවාරි මාසයේ දී සාර්ථක ලෙස අවසන් කරන ලදී.

ප්‍රධාන පර්යන්ත ගොඩනැගිල්ල, පියර් 2 සහ පියර් 3 සඳහා පයිලිං, පයිල් කැප් සහ බිම් බාල්ක ඉදිකිරීම ඇතුළු නිශ්චිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා 2024 අප්‍රේල් මාසයේදී නව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මුළු කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 3,255 ක් වන අතර, ව්‍යාපෘතිය 2024 අවසන් වන විට 69% ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 1,212 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2025 පෙබරවාරි මැද භාගයේ දී නිම කිරීමට අපේක්ෂිතය.

රජයේ තීරණයකට අනුව, නවතා දැමූ මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා 2024 සැප්තැම්බර් මාසයේදී ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කළේය. ලංසු කැඳවීමේ ක්‍රියාවලිය මුලින් 2024 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද, ලංසුකරුවන්ගේ ඉල්ලීම පරිදි 2025 මාර්තු 18 දක්වා දීර්ඝ කරන ලදී. නැවත ආරම්භ කරන මෙම ව්‍යාපෘතිය 2028 මාර්තු වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

- **පිටත්වීමේ පර්යන්තයේ ගමන් මලු සැකසීම් සඳහා වූ පහසුකම වැඩි දියුණු කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (බ.ජා.ගු) පිටත්වීමේ ගමන් මලු හැසිරවීමේ ධාරිතාව ආසන්න වශයෙන් 45% කින් වැඩි දියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ පිටත්වයන ගමන් මලු සැකසීමේ කැරොසල් ප්‍රතිසංස්කරණය සහ දිගු කිරීම සිදුවන අතර ඒ සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද සිදුකරයි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 852 කි. 2024 අවසන් වන විට ව්‍යාපෘතිය 82% ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 861 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

- **ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල පළමු අදියර**

ආනයන ගුවන් භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි වාර්ෂික ගුවන් භණ්ඩ හැසිරවීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 150,000 කින් වැඩි කරයි. රුපියල් බිලියන 2.4 ක් වැය කෙරෙන මෙම ව්‍යාපෘතිය මගින් තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මාර්ග පුළුල් කිරීම සහ වර්ග අඩි 1,620 ක වාහන නැවැත්වීමේ පහසුකම් සැකසීම සිදුකරයි. මෙහි ඉදිකිරීම් 2021 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර, 2024 දෙසැම්බර් වන විට නිම කිරීමට ඉලක්ක කරන ලදී. 2024 අවසානය වන විට, ව්‍යාපෘතිය 98% ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 3,830 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

- **මගී පර්යන්ත වැසිකිළි පහසුකම් වැඩි දියුණු කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ, මගී පර්යන්තයේ සහ පියර් ගොඩනැගිල්ලේ පවතින වැසිකිළි ඒකක හයක් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2024 දී නිම කරන ලද අතර, මුළු පිරිවැය රුපියල් මිලියන 304 කි.

- **ගගන නාවික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.**

- **නිරීක්ෂණ රේඩාර් පද්ධතියක් (Secondary Surveillance Rada System) පිදුරුතලාගල ස්ථාපිත කිරීම**: මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1,710 ක් ඇස්තමේන්තු කොට ඇති අතර 2018 දී ආරම්භ කරන ලදී. 2024 වසර අවසන් වන විට, උපකරණ එම ස්ථානයට ලබා දී තිබූ අතර, සිවිල් ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පැවති අතර, භෞතික ප්‍රගතිය 78% ක් අත්කර ගෙන තිබුණි. 2024 දක්වා මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 536 කි.

- **ගුවන් ගමන් කළමනාකරණ පද්ධතිය (Air Traffic Management System) ස්ථාපිත කිරීම**: ගුවන් ගමනාගමන පාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා නව ATM පද්ධතියක් ස්ථාපිත කරන ලද අතර එය 2023 වසර අවසානයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරයි. මෙම පද්ධතිය අවම වශයෙන් ඉදිරි වසර 10 ක භාවිතය සඳහ නිර්මාණය කර ඇත. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 1.15 කි. 2024 අවසන් වන විට, ව්‍යාපෘතිය 99% ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 717 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි.

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි ගුවන් ධාවන පථයේ 04 අන්තය සඳහා උපකරණ සහාය මත ගුවන් යානා ගොඩබෑමේ පද්ධතියක් (Instrument Landing System) ස්ථාපිත කිරීම** :රුපියල් මිලියන 875 ක් වටිනා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය 2023 වසරේදී ලැබුණු අතර කොන්ත්‍රාත්තුව අත්සන් කොට ඇත. 2024 වසර අවසන් වන විට, සැලසුම් සමාලෝචනය අවසන් කරන ලද අතර, එය සමස්ත ව්‍යාපෘතියේ 70% ක භෞතික ප්‍රගතියක් සනිටුහන් කරයි.

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා එක්ස්-රේ ගමන් මලු පිරික්සුම් පද්ධතිය (X-Ray Baggage Screening System):** බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා ගමන් මලු පිරික්සුම් එක්ස්-රේ පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 319 කි. නව පද්ධතිය 2024 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කරන ලද අතර අවසාන පිළිගැනීමේ සහතිකය නිකුත් කර ඇත.

- **ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය (*Automatic Weather Observation System*):** මෙම රුපියල් මිලියන 307 ක ව්‍යාපෘතිය 2024 ඔක්තෝබර් 15 වන දින ආරම්භ කරන ලද අතර, තාවකාලික පිළිගැනීමේ සහතිකය නිකුත් කර ඇත.

## 7.1.2 මෙහෙයුම් කාර්ය සාධනය

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (බ.ජා.ගු.)**

2024 දී, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විසින් ගුවන් යානා මෙහෙයුම් 59,263 ක් හසුරුවා ඇති අතර, ජාත්‍යන්තර මෙහෙයුම් 54,804 ක් සහ දේශීය මෙහෙයුම් 4,459 ක් ඇතුළත් වේ. ගුවන් තොටුපොළ ජාත්‍යන්තර මගීන් 8,711,992 ක් සහ දේශීය මගීන් 6,171 ක් සඳහා සේවා සපයා ඇත. බණ්ඩාරනායක ජාත්‍යයන්තර ගුවන්තොටුපොළ විසින් හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 118,191 කි. 2023 ට සාපේක්ෂව, මගී සංචලනය 18% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර ගුවන් යානා චලනයන් 19% කින් වැඩි විය. මීට අමතරව, භාණ්ඩ ප්‍රවාහනය 2023 ට සාපේක්ෂව 21% කින් ඉහළ ගොස් ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලෙහි මේ වසරේ සැලසුම්ගත ගුවන් මෙහෙයුම් සිදුකරන ගුවන් සමාගම් 26 කින් සමන්විත පියාසැරි ජාලයක් පැවති අතර, එය පූර්ව කෝවිඩ් 19 කාලයේ පැවති තත්ත්වයට ලගා වීමකි.

- **මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (ම.රා.ජ.ගු.)**

2024 දී, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ගුවන් යානා මෙහෙයුම් 709 ක් සිදු කළ අතර, ඉන් ජාත්‍යන්තර මෙහෙයුම් 654 ක් සහ දේශීය මෙහෙයුම් 55 ක් ඇතුළත් විය. ගුවන්තොටුපොළ මගී මෙහෙයුම් 132,852 කට පහසුකම් සැලසූ අතර, ඒ සියල්ල ජාත්‍යන්තර විය. වසර තුළ මුළු භාණ්ඩ මෙට්‍රික් ටොන් 23 ක් හසුරුවන ලදී. 2023 ට සාපේක්ෂව, මගී මෙහෙයුම් 6% කින් වර්ධනය වූ අතර ගුවන් යානා මෙහෙයුම් 17% කින් වැඩි විය. භාණ්ඩ මෙහෙයුම් පෙර වසරට සාපේක්ෂව 2024 දී 21% ක වැඩිවීමක් පෙන්නුම් කළේය. එමෙන්ම, රෙඩ්වින්ග්ස් ගුවන් සේවය (Redwings Airlines) 2024 දී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළහි මෙහෙයුම් ආරම්භ කළේය.

- **යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (යා.ජා.ගු.)**

ජාත්‍යන්තර ගුවන් ගමන් 778 ක් සහ දේශීය ගුවන් ගමන් 378 ක් (පුහුණු ගුවන් ගමන් ඇතුළුව) ඇතුළුව ගුවන් යානා මෙහෙයුම් 1,156 ක් යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විසින් මෙම කාලය තුල හසුරුවන ලදී. 2024 දී, ජාත්‍යන්තර මගීන් 39,156 ක් ඇතුළුව මගීන් 46,680 ක් සඳහා යාපනය ජාත්‍යයන්තර ගුවන්තොටුපොළ පහසුකම් සපයන ලදී. මගී හැසිරවීම 37% කින් වර්ධනය වූ අතර, 2023 ට සාපේක්ෂව ගුවන් යානා චලනයන් 34% කින් වැඩි විය. වර්තමානයේ, එලායන්ස් එයාර් (Alliance Air) යාපනය සහ චෙන්නායි අතර සතියකට නියමිත ගුවන් ගමන් 7 ක් ක්‍රියාත්මක කරයි.

- **රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (කො.ජා.ගු.ර.)**

2024 වසර තුළ කොළඹ ජාත්‍යයන්තර ගුවන්තොටුපොළ ගුවන් යානා මෙහෙයුම් 23,229 ක් (පුහුණු ගුවන් ගමන් ඇතුළුව) හසුරුවා ඇති අතර ගුවන් මගීන් 2,756 කට පහසුකම් සපයා ඇත. මෙයට ජාත්‍යන්තර ගුවන් යානා මෙහෙයුම් 53 ක් සහ ජාත්‍යන්තර මගීන් 10 ක් ඇතුළත් වූ අතර, එයින් පෙන්නුම් කරන්නේ මෙම ගුවන්තොටුපොළ මගී ගමනාන්තයකට වඩා හදිසි තාක්ෂණික නැවතුමක් හෝ කෙටි කාලයකට ගුවන් යානා නැවැත්වීමේ ස්ථානයක් ලෙස භාවිතා කර ඇති බවයි.

කොළඹ ජාත්‍යාන්තර ගුවන්තොටුපොලෙහි මෙහෙයුම්වල සැලකිය යුතු කොටසක් වන පුහුණු ගුවන් ගමන් ඇතුළුව දේශීය ගුවන් යානා මෙහෙයුම් 2024 දී 3% කින් වැඩි වී ඇත. 2023 වසරට සාපේක්ෂව දේශීය මගී චලනයන් ද 3% ක වර්ධනයක් පෙන්නුම් කළේය.

- **මඩකලපුව ජාත්‍යාන්තර ගුවන්තොටුපොළ (ම.ජා.ගු.)**

2024 දී, මඩකලපුව ජාත්‍යයන්තර ගුවන්තොටුපොළ දේශීය ගුවන් යානා චලනයන් 432 ක් සහ දේශීය මගී චලනයන් 1,107 ක් සඳහා පහසුකම් සපයන ලදී. මෙහෙයුම් මට්ටම 2023 ට අනුකූලව පැවතුනි. 2018 දී නැවත විවෘත කිරීමෙන් පසු මේ දක්වා මඩකලපුව ජාත්‍යාන්තර ගුවන්තොටුපොලෙහි ජාත්‍යාන්තර මෙහෙයුම් කිසිවක් සිදු කර නොමැත.

**2024 දී සියලුම ගුවන් තොටුපොළවල ගුවන් යානා, මගී සහ භාණ්ඩ මෙහෙයුම්**

| | මුළු ගුවන් යානා මෙහෙයුම් | | | මුළු මගී මෙහෙයුම් | | | මුළු ගුවන් භාණ්ඩ මෙහෙයුම් (මෙ.ටො) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ගුවන්තොටුපළ** | **2023** | **2024** | වර්ධනය | **2023** | **2024** | වර්ධනය | **2023** | **2024** | වර්ධනය |
| **බ.ජා.ගු.** | 49,664 | 59,263 | 19% | 7,398,257 | 8,718,163 | 18% | 158,867 | 192,475 | 21% |
| **ම.රා.ජ.ගු.** | 608 | 709 | 17% | 125,658 | 132,852 | 6% | 44 | 23 | -47% |
| **යා.ජා.ගු.** | 864 | 1,156 | 34% | 29,717 | 40,680 | 37% | - | - | 0% |
| **ම.ජා.ගු.** | 436 | 432 | -0.9% | 1,309 | 1,107 | -15% | - | - | 0% |
| **කො.ජා.ගු.ර.** | 22,667 | 23,229 | 2% | 3,594 | 3,227 | -10% | - | - | 0% |
| **එකතුව** | 74,239 | 84,789 | 14% | 7,558,535 | 8,896,029 | 18% | 158,911 | 192,498 | 21% |

## 7.1.3 මූල්‍ය කාර්ය සාධනය

රු. මි.

| **අයිතමය** | 2023 | 2024 විගණනය නොකළ |
|---|---|---|
| ආදායම | 38,376 | 42,665 |
| මෙහෙයුම් වියදම් | 19,061 | 23,734 |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | 19,315 | 18,930 |
| ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය) | 10,428 | 7,740 |
| ණය පොලී | 2,225 | 1,352 |
| විනිමය (ලාභ)/ පාඩුව | (6,121) | (2,034) |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **33,639** | **27,352** |

## 7.2 අනාගත ව්‍යාපෘති සහ වැඩසටහන්

### 1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ල ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම

මගී පර්යන්ත ගොඩනැගිල්ලේ පවතින ධාරිතාව ඵලදායී ලෙස භාවිතා කිරීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ මගී පර්යන්තයේ ධාරිතාව ඉක්මයාම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා, 2025 සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කිහිපයක් සැලසුම් කර .

- **පිටත්වීමේ පර්යන්තයට ගුවන් මගීන් පරීක්ෂා කිරීමේ කවුලු 30ක් එකතු කිරීම:** සන්කෙන් පෞද්ගලික සමාගම (Sanken (Pvt) Ltd.) විසින් ගොනු කරන ලද අධිකරණ නඩුවක් හේතුවෙන් පිටත්වීමේ පර්යන්තයට අමතර ඇතුල්වීමේ කවුන්ටර 30ක් එක් කිරීමේ ව්‍යාපෘතිය දැනට අත්හිටුවා ඇත. අවසාන නඩු විභාගයෙන් පසුව ව්‍යාපෘතිය ඉදිරි වසර තුලදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.
- **ගුවන් මගීන් පිටත්වීමේ පර්යන්තයේ ඇති මගීන් පරීක්ෂා කිරීමේ කවුලු ප්‍රමාණය පුළුල් කිරීම:** ගුවන් මගීන් පිටත්වීමේ පර්යන්තයේ දැනට ඇති මගී පරීක්ෂා කිරීමේ කවුලු 58 හි විශාලත්වය අඩු කිරීමෙන් අමතර කවුලු 16 ක් අලුතින් එක් කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 300 ක් වැය කිරීමට බලාපොරොත්තු වේ.
- **පැමිණීමේ පර්යන්තයේ ආගමන රැඳවුම් ප්‍රදේශයක් ස්ථාපිත කිරීම:** රුපියල් මිලියන 350 ක ආයෝජනයකින් පැමිණීමේ ආගමන රැඳවුම් ප්‍රදේශයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඉලෙක්ට්‍රෝනික වෙළඳසැල් ඉහළ මහලට ගෙන යාමෙන් පසු හිස් වූ ඉඩෙහි තීරු බදු රහිත සාප්පු ස්ථාපිත කිරීමට පෙර ගත් තීරණය වෙනස් කොට මෙම සැලැස්මට අනුව ආගමන මගී පරීක්ෂා කවුලු ගණන 25 සිට 36 දක්වා වැඩි කෙරෙන අතර, ආගමන මගී පරීක්ෂා පෝලිම් දිග මීටර් 12 සිට මීටර් 16.6 දක්වා පුළුල් කිරීමට අපේක්ෂිතය. ඊට අමතරව, තීරුබදු රහිත සාප්පු සඳහා ඇති අවකාශය වැඩි දියුණු කරනු ඇත.
- **පැමිණීමේ පර්යන්තයේ ලොබි ප්‍රදේශය සඳහා නව මුහුණුවරක් ලබා දීම:** පැමිණීමේ පර්යන්ත ලොබි ප්‍රදේශය රුපියල් මිලියන 500ක් වැය කරමින් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂිතය.

### 2. ස්වයංක්‍රීය ආගමන හා විගමන පාලනය - E-gates ව්‍යාපෘතිය

මිනිස් මැදිහත්වීමකින් තොරව ආගමන හා විගමන පාලන ක්‍රියාවලීන් සිදු කිරීමේ ආරම්භයක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපොලෙ හි පිටත්වීම් පර්යන්තයන්තට විද්‍යුත් දොරටු (E-gates) හතරක් ස්ථාපනය කිරීමට AASL සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය AASL සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරයි. ජත්‍යාන්තර සංක්‍රමිණිකයන්ගේ සංවිධානය (IMO) තවත් විද්‍යුත් දොරටු හතරක් ලබා දීමට එකඟ වී ඇති අතර ඒවා පැමිණීමේ පර්යන්තයේ ස්ථාපනය කිරීමට නියමිතය. මෙමගින් පිටත්වීමේ සහ පැමිණීමේ පර්යන්ත සඳහා විද්‍යුත් දොරටු හතරක් බැගින් ස්ථාපනය කිරීමට හැකි වනු ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්තුව 2023 ජුනි 8 වන දින අත්සන් කරන ලදී; කෙසේ වෙතත්, ගිවිසුමේ නියමයන්ට අනුව භාණ්ඩ ලබා දීමට කොන්ත්‍රාත්කරුට නොහැකි විය. ඒ අනුව පැහැර හැරීමේ ලිපියක් කොන්ත්‍රාත්කරුට නිකුත් කරන ලද අතර, ලංසු ආපසු කැඳවීමට තීරණය කරන ලදී.

## 3. ව්‍යාවසාය සම්පත් සැලසුම් කිරීමේ (ERP) ව්‍යාපෘතිය

සියලුම තොරතුරු අවශ්‍යතා මෘදුකාංග පද්ධතියක් හරහා ඒකාබද්ධ කිරීම තුලින් රටේ ගුවන් සේවා ඉදිරි සැලසුම් වලට අනුගත වූ ආයතනයේ දැක්ම සහ උපාය මාර්ගික ඉලක්ක වඩා ඵලදායී ලෙස සපුරාලීම අරමුණු කරගත් ව්‍යාවසාය සම්පත් සැලසුම් කිරීමේ (ERP) ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවති. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත විය.

පළමු අදියර යටතේ, 2021 ජූලි 15 වන දින මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ ක්‍රියාවලි මොඩියුල ක්‍රියාත්මක කරන ලද අතර, අවසාන පිළිගැනීමේ සහතිකය 2023 අවසානයේ නිකුත් කරන ලදී. දෙවන අදියර 2025 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. පළමු අදියරේ මුළු පිරිවැය රුපියල් මිලියන 160 ක් වූ අතර දෙවන අදියරේ ඇස්තමේන්තුගත පිරිවැය (උපදේශන සේවා වියදම් ඇතුළුව) රුපියල් මිලියන 370 ක් පමණ වනු ඇත.

## 4. කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ රත්මලානෙහි (කො.ජා.ගු.ර.) ගුවන්තොටුපොළ මෙහෙයුම් ගොඩනැගිලි සංකීර්නයක් ඉදිකිරීම

කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ රත්මලාන සඳහා 2030 වසර දක්වාවූ ප්‍රාග්ධන සැලැස්ම යටතේ වූ මෙහෙයුම් ක්ෂේත්‍ර පහෙන් හතරක් පමනක් දැනට ක්‍රියාත්මක කර ඇති අතර, කලාපීය මෙහෙයුම් වැඩිදියුණු කිරීම තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිතයි. දැනට, මෙහෙයුම් අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක වන අතර, මෙම අංශ පහේම තවදුරටත් වර්ධනයක් ඇතිකිරීමට විභවයක් ඇත. කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ රත්මලානෙ හි මෙහෙයුම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා, නව ගුවන්තොටුපොළ මෙහෙයුම් සංකීර්ණයක් ඉදිකිරීම 2025 අප්‍රේල් මාසයේදී ආරම්භ කර 2026 නොවැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 4.6 කි.

## 5. මත්තල රජපක්ෂ ජාත්‍යන්තර ගුවතොටුපොළ (ම.ර.ජා.ගු.) මෙහෙයුම්

මත්තල රජපක්ෂ ජාත්‍යන්තර ගුවතොටුපොළ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා කැමැත්ත ප්‍රකශකර සිටී ශෞර්‍ය එරනොටික්ස් පෞද්ගලික සමාගම (Shaurya Aeronautics (Pvt) Ltd) සහ රුසියානු සමාගම යන දෙකටම එරෙහිව එක්සත් ජනපද සම්බාධක පැනවීමෙන් පැන නගින නීතිමය තත්ත්වය හේතුවෙන් මත්තල රජපක්ෂ ජාත්‍යන්තර ගුවතොටුපොලෙහි මෙහෙයුම් කළමනාකරණය ඉන්දියානු - රුසියානු ඒකාබද්ධ ව්‍යාපාරයට (J/V) පැවරීමේ තීරණය අත්හිටුවා ඇත. මත්තල රජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිරි මෙහෙයුම් පවත්වගෙන යම සඳහා වූ විකල්පය ඉක්මනින් ප්‍රකාශයට පත්කරනු ඇත.

## 6. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනය

විශාල ගුවන් යානා සඳහා පහසුකම් සැලසීම සඳහා යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ තවදුරටත් පුළුල් කරන්නේද යන්න පිළිබඳ තීරණය තවමත් ගෙන නොමැත. මේ සඳහා පුළුල් ශක්‍යතා අධ්‍යයනයක් 2025 වසරේදී සිදුකිරීමට සැලසුම් කර ඇත. සිවිල් ගුවන් නියාමන නිර්දේශ මත පදනම්ව මාර්ග ඉදිකිරීම්, මගී පර්යන්තය වෙනස් කිරීම් සහ අනෙකුත් ගුවන්තොටුපොළ පහසුකම් වැඩිදියුණු කිරීම් ඇතුළු සියලුම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ආවරණය වන පරිදි යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධන අරමුදල සඳහා සමාගමේ 2025 අයවැයෙන් රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.

## 7. BIA හි සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය

තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ඉදිරියට යමින් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ වර්ධනය වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය හා භාවිතය ඉහළ නැංවීමට AASL මෙම ව්‍යාපෘතිය යටතේ පියවර ගෙන ඇත. මෙම සැලැස්මේ කොටසක් ලෙස, 2025

වසරේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ රත්මලාන සහ මත්තල රජපක්ෂ ජාත්‍යන්තර ගුවතොටුපොළ වල 2500 kWp ක් බෙදා හරින සූර්ය බලශක්ති පද්ධතියක් ක්‍රියාත්මක කෙරෙන අතර, එහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 200 කි. ඊට අමතරව, 2025 වසරේ දී පර්යන්ත ගොඩනැගිලි වහල මත 600 kWp ක සූර්ය බලශක්ති පද්ධතියක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර, එහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 120 කි.